# යෝගියාකාර්ටා මූලධර්මයන්

ලිංගික නැඹුරුතාවය සහ
සමාජ ලිංගික අනන්‍යතාවය
හා සබැඳි ජාත්‍යන්තර
මානව හිමිකම් නීතිය සමගින්
භාවිත මූල ධර්මයන්

# යෝග්‍යකාර්තා මූලධර්මයන්

**ලිංගික නැඹුරුතාවය සහ
සමාජ ලිංගික අනන්‍යතාවය
හා සබැඳි ජාත්‍යන්තර
මානව හිමිකම් නීතිය සමගින්
භාවිත මූල ධර්මයන්**

සිංහල පරිවර්තනය: නදී ජයවීර සහ නිහාල් සේනාරත්න
ප්‍රකාශක: ඊක්වල් ග්‍රවුන්ඩ්, ශ්‍රී ලංකා 2010

# පටුන


හැඳින්වීම ........ 6

පෙරවදන ........ 8

මූලධර්මය 1. විශ්ව මානව හිමිකම් භුක්ති විඳීමේ අයිතිය ........ 10

මූලධර්මය 2. සමානාත්මතාවය විඳීමේ සහ නොවෙනස් ලෙස සැලකුම් ලැබීමේ අයිතිය ........ 10

මූලධර්මය 3. නීතිය ඉදිරියේ පිළිගැනීමේ අයිතිය ........ 11

මූලධර්මය 4. ජීවිතයට ඇති අයිතිය ........ 12

මූලධර්මය 5. පුද්ගල රැකවරණය සඳහා ඇති අයිතිය ........ 13

මූලධර්මය 6. පෞද්ගලිකත්වයට ඇති අයිතිය ........ 13

මූලධර්මය 7. අත්තනෝමතිකව ස්වාධීනත්වය අහිමිකිරීමෙන් නිදහස් වීමේ අයිතිය ........ 14

මූලධර්මය 8. සාධාරණ විනිශ්චයක් ලැබීමේ අයිතිය ........ 15

මූලධර්මය 9. වදහිංසා සහ කෲර අමානුෂික හෝ ආත්ම ගෞරවය කෙළෙසන සැළකීම් හෝ දඬුවම්වලින් නිදහස්වීමේ අයිතිය ........ 16

මූලධර්මය 10. අත්අඩංගුවට පත් වූ අවස්ථාවක දී මානුෂික ලෙස සැලකීම් ලැබීමේ අයිතිය ........ 16

මූලධර්මය 11. සියලුම ආකාරයන්ගේ සූරාකෑමෙන්, මිනිස් කුට්ටනයට ලක්වීමෙන් හා ජාවාරමෙන් ආරක්ෂාවීමට සියලුම දෙනාට අයිතියක් ඇත ........ 17

මූලධර්මය 12. වැඩකිරීමේ අයිතිය ........ 18

මූලධර්මය 13. සමාජ ආරක්ෂණය සහ වෙනත් සමාජීය ආරක්ෂණයන් සඳහා ඇති අයිතිය ........ 18

මූලධර්මය 14. ප්‍රමාණවත් ජීවන තත්වයක් සඳහා ඇති අයිතිය ........ 19

මූලධර්මය 15. ප්‍රමාණවත් නිවාස සඳහා ඇති අයිතිය ........ 19

මූලධර්මය 16. අධ්‍යාපනය ලැබීම සඳහා ඇති අයිතිය ........ 20

මූලධර්මය 17. ලබා ගතහැකි උසස්ම තත්වයේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ අයිතිය ........ 21

මූලධර්මය 18. වෛද්‍ය අපයෝජනයෙන් ආරක්ෂාවීමේ අයිතිය ........ 22

මූලධර්මය 19 මතයක් දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහස ........ 23

මූලධර්මය 20. සාමකාමීව රැස්වීමට හා සංවිධානය වීමට ඇති අයිතිය ........ 23

මූලධර්මය 21. සිතීමට, හෘද සාක්ෂියට හා ආගමට ඇති අයිතිය ........ 24

මූලධර්මය 22. නිදහසේ සංචාරය කිරීමේ අයිතිය ........ 25

මූලධර්මය 23. වෙනත් රටක ආරක්ෂාව පැතීමේ අයිතිය ........ 25

මූලධර්මය 24. පවුලක් ගොඩනගා ගැනීමේ අයිතිය ........ 26

මූලධර්මය 25. පොදු කටයුතු වලට සහභාගීවීමේ අයිතිය ........ 27

මූලධර්මය 26. සංස්කෘතික ජීවිතයට සහභාගීවීමේ අයිතිය ........ 27

මූලධර්මය 27. මානව අයිතිවාසිකම්වලට අනුබල දීමේ අයිතිය ........ 28

මූලධර්මය 28. ඵලදායී ප්‍රතිකර්ම සහ පිළියම් ලබා ගැනීමේ අයිතිය ........ 28

මූලධර්මය 29. වගකීම් සහගත බව ........ 29

අතිරේක නිර්දේශයන් ........ 30

ඇමිණුම ........ 32

# යෝගියාකාර්ටා මූලධර්මයන් පිළිබඳ හැඳන්වීම

සෑම මනුෂ්‍ය වර්ගයක්ම උපත ලබා ඇත්තේ සමානාත්මතාවය හා ගෞරවය පෙරදැරි කරගෙනය. සියලු මිනිස් අයිතිවාසිකම් විශ්වසාධාරනීයද, නොබෙදිය හැකිද පමණක් නොව එකිනෙක සමඟ බැඳිද පවතියි[1]. ලිංගික නැඹුරුව සහ[2] සමාජ ලිංගික අනන්‍යතාවය  සෑම පුද්ගලයකුගේම ගෞරවයට හා මනුෂ්‍යත්වයට අනුකූලවූ සාධකයක් වන අතරම එය කෙනෙකුට වෙනස්ලෙස සැලකීමට හෝ අපයෝජනයට ලක් කිරීමට හෝ සාධකයක් නොවිය යුතුය.

සියළු ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ ලිංගික අනන්‍යතාවයන්ට අයත් පුද්ගලයන්ට සියල්ලන්ටම පොදු වූ සමාන ගෞරවයකින් හා අභිමානයකින් ජීවත් වීම සහතික කරවීමට බොහෝ උත්සහයන් දරා ඇත. වර්තමානයේ බොහෝ රජයන් නීති පද්ධතීන් හා ව්‍යවස්ථාවන් සම්මත කිරීම තුළින් ලිංගිකත්වය, ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම් වූ වෙනස්කොට සැලකීමට විරුද්ධවීමට සහ සමානාත්මතා අයිතිවාසිකම් තහවුරු කිරීමට ප්‍රයත්න දරා ඇත.

කෙසේවෙතත්, පුද්ගලයෙකුගේ සැබෑ හෝ අනුමාන කරන්නාවු ලිංගික නැඹුරුතාවයන් හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම්ව සිදුවන මානව හිමිකම් උල්ලංඝනයන් ගේ ගෝලීයවූත් මුල්බැසගත් රටාව හේතුවෙන් ගැඹුරු සැළකීමක් දක්වයි. නීතියෙන්-පරිබාහිර මිනීමැරීම, වධ හිංසනය සහ පීඩාකිරීම, ලිංගික අඩන් තේට්ටම සහ දූෂණය, පෞද්ගලිකත්වය ආක්‍රමනය කිරීම, අත්තනෝමතික රඳවා තබාගැනීම, රැකියා අයිතිය ප්‍රතික්ෂේප කිරීම, අධ්‍යාපන අවස්ථාවන්ට බාධා කිරීම, සහ වෙනත් මානව හිමිකම් භුක්ති විඳීමේ අවස්ථාවන් බලගතු ලෙස නොසලකා හැරීම් තුලට ඇතුළත් වේ. මෙම කඩකිරීම් බොහෝ අවස්ථාවන්හිදී වාර්ගිකත්වය, වයස, කුලය, ආගම, ආබාධිත බව හෝ ආර්ථික සහ සමාජීය හෝ වෙනත් තත්වයන් මත පදනම්ව කෙරෙන වෙනත් ප්‍රචණ්ඩත්වයන්, වෛරයන්, නොසළකාහැරීම් සහ බැහැරකිරීමේ අත්දැකීම් වලින් සංයුක්ත වේ.

බොහෝ රජයන් හා සමාජයන් සමාජ ලිංගිකත්වය සහ ලිංගික නැඹුරුතා ධර්මතාවයන් පුද්ගලයන්ට සිරිත් විරිත්, නීතීන් සහ ප්‍රචණ්ඩත්වයන් හරහා නියම කරන අතර ඒ තුළින් තම පුද්ගලික සම්බන්ධතාවයන් අත්දකින ආකරය, තමන්ව හඳුන්වාගන්නා ආකාරය පාලනය කිරීමට උත්සහ දරයි. ලිංගිකත්වයට රැකවල් දැමීම, නොනවත්වා ක්‍රියාත්මක වන සමාජ ලිංගිකතවය-මත-පදනම්-ප්‍රචණ්ඩත්වය සහ සමාජ ලිංගික අසමානතාවයන්ට ප්‍රබල බලපෑමක් ඇතිකරන්නාවූ සාධකයක් සේ පවතියි.

සමාජ ලිංගිකත්ව සමානාත්මතාවය හා සමාජය, ප්‍රජාව සහ පවුල තුළ ඇති ප්‍රචණ්ඩත්වයට එරෙහි ආරකෂනය සහතික කිරීමේ දී ජාත්‍යන්තර ක්‍රමයන් ඉතා වැදගත් ඉදිරි පියවරයන් තබා ඇත. තවද, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිලිබඳ ප්‍රධාන යාන්ත්‍රනය විසින් ලිංගික නැඹුරුතාව සහ සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම්වවූ නොසැලකීම් වලින් සෑම පුද්ගලයෙකුගේම ආරක්ෂාව සහතික කිරීමට රජයන් බැඳි ඇත. කෙසේවෙතත්, සමාජ ලිංගිකත්ව අනන්‍යතාවයන් හා ලිංගික යොමුවීම් මත පදනම් වූ මානව හිමිකම් කඩකිරීම් සම්බන්ධයෙන් යොමුවන ජාත්‍යන්තර අවධානය සහ ප්‍රතිචාරය අපහැදිලි සහ බිඳුනු ස්වභාවයක් දක්නට ලැබෙයි.

මෙම හිඩැස ආමන්ත්‍රණය කිරීමට ලිංගික යොමුවීම් සහ සමාජ-ලිංගික අනන්‍යතාවයන් ට අදාල ගැටලු සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතීන් සහ භාවිතාවන් සම්බන්ධයෙන් පවත්නා සමස්ථ පාලන ක්‍රමය පිළිබඳව නිශ්චිත අවධානයක් තිබීම වැදගත්ය. සෑම පුද්ගලයෙකුගේම

01 ලිංගික නැඹුරුතාව යන්නෙන් අදහස් වන්නේ වෙනස් හෝ සාමාන හෝ සමාජ ලිංගිකයෙකු වෙත හෝ එක් සමාජ ලිංගිකයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් වෙත හෝ ඉතා හැඟීම්බරව, හෘදයාංගමව ආදරය කිරීමට, ලිංගිකව ආකර්ශනය වීමට සහ අතිශයින්ම සමීප ලිංගික සම්බන්ධතාවයක් පැවැත්වීමට පුද්ගලයෙකුට ඇති හැකියාව යි.



02 සමාජ ලිංගිකත්ව අනන්‍යතාවය යනුවෙන් අදහස් කරන්නේ උපතින් ලැබූ ලිංගිකය සමඟ සමාන හෝ නොසමාන වුවත් පුද්ගලයෙකුට ගැඹුරින් දැනෙන සහ අත්දැකින්නාවූ සමාජ ලිංගිකත්වය යි. තමන්ගේ ශරීරය පිළිබඳව ඇති හැඟීම, (ශාරීරික අවයවයන්, බාහිර පෙනුම හෝ ශාරීරික ක්‍රියාකාරීත්වයන්, වෛද්‍ය හෝ සැත්කම් හෝ වෙනත් ආකාරයන් ගෙන් සිය කැමැත්තෙන් වෙනස් කරගැනීම යන්නද අයත් විය හැක)  සහ ඇඳුම් පැලඳුම්, කතාබහ සහ හැසිරීම් චර්යා රටාවන් සහ ඇවතුම් පැවතුම් වැනි සමාජ ලිංගිකත්වය හඟවන වෙනත් ප්‍රකාශයන්ද මීට ඇතුළත් වේ

වෙනස්කමකින් තොරවූ සමානත්මතාවය මත පදනම්ව සියලුම මානව හිමිකම්  ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීම සඳහා පවතින මානව අයිතිවාසිකම් පිලිබඳ ජාත්‍යන්තර නීතිය හමුවේ රජයක වගකීම සැසඳීම සහ පැහැදිලි කරගැනීම තීරණාත්මක වේ.

මානව හිමිකම් සංවිධාන සාමූහිකය වෙනුවෙන් ජාත්‍යන්තර නීතිවේදි සභාව සහ මානව හිමිකම් සඳහා වන ජාත්‍යන්තර සේවාව විසින් රජයන් දරන්නාවූ මානව හිමිකම් පිළිබඳ වගකීමට වැඩි පැහැදිලි බවක් සහ සංගතභාවයක් ලබාදීමට සමාජ-ලිංගික අනන්‍යතාවයන් හා ලිංගික නැඹුරුතාවයන් මත පදනම්ව සිදු කෙරෙන මානව හිමිකම් කඩකිරීම්වලට අදාලවන ජාත්‍යන්තර මානව හිමිකම් නීතීන් භාවිතා කිරීමට ජාත්‍යන්තර නීතිමය මූලධර්මයන් සැකසීමේ ව්‍යාපෘතිය බාරගන්නා ලදී.

මානව හිමිකම් පිළිබඳ කීර්තිමත් ප්‍රවීනයන් කණ්ඩායමක් විසින් කෙටුම්පත් කර, වැඩිදියුණු කර, සාකච්ඡා කිරීමෙන් පසු, නැවත සංශෝධනය කර මෙම මූලධර්මයන් සකස් කරන ලදී. 2006 වසරේ නොවැම්බර් මස 6 සිට 9 දක්වා ඉන්දුනීසියාවේ යෝගියාකාර්ටා නුවර, “ගජාස්මඩා විශ්වවිද්‍යාලයේදී” පැවැත්වූ ප්‍රවීණයන්ගේ හමුවෙන් අනතුරුව මානව හිමිකම් නීතිය හා බැඳුනු ගැටලු පිළිබඳ විශේෂඥ දැණුම සහිත සහ විවිධ වූ පසුබිම් වලින් රටවල් 25 නියෝජනය කරමින් පැමිණි ප්‍රවීණයන් 29 දෙනෙකු විසින් ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ ලිංගික අනන්‍යතාවයන්ට ආදාල ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය භාවිතා කිරීමේ යෝගියාකාර්ටා මූලධර්මයන් ඒකමතිකව සම්මත කරගන්නා ලදි.

මෙම මූලධර්මයන් කෙටුම්පත් කිරීමේදි හා සංශෝධනය කිරීමේදී සමුළුවේ ප්‍රකාෂක “මහාචාර්ය මයිකල් ඔෆ්ලහැට් මහතා” විසින් අප්‍රමාන දායකත්වයක් ලබාදෙන ලදි. ඔහුගේ කැපවීම හා උද්යෝගිමත් දායකත්වය මෙම ක්‍රියාවලිය සාර්ථක කරගැනීමට තීරණාත්මකව උපකාරී විය.

ලිංගික නැඹුරුතාවය සහ සමාජ ලිංගික අනන්‍යතා ගැටලූන්ට අදාලවන පුළුල් පරාසයක විහිදුනු මානව හිමිකම් ප්‍රමිතීන් සහ එහි භාවිතාවන් යෝගියාකාර්ටා මූලධර්මයන් විසින් ආමන්ත්‍රණය කරයි. මානව අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවීමට රජයන් සතු මූලික වගකීම මෙම මූලධර්මයන් විසින් තහවුරු කරයි. සෑම මූලධර්මයක් යටතේ රජයන් සඳහා විස්තරාත්මක නිර්දේශ ලබා දී ඇත. එපමණක් නොව, ප්‍රවීණයන් විසින්, මානව හිමිකම් ආරකෂා කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට සෑම පාර්ශවයකටම වගකීමක් ඇති බවද අවධාරණය කරයි. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය, ජාතික මානව හිමිකම් පර්යේශනායතන, මාධ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන, විවිධ ආධාර ආයතන වැනි අනෙක් පාර්ශවයන්ට අතිරේක නිර්දේශයන්, යොමුකර ඇත.

ලිංගික යොමුවීම් සහ සමාජ ලිංගික අනන්‍යතා ගැටලූන්ට අදාලව ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ තත්වය යෝගියාකාර්ටා මූලධර්මයන් තුළින් නිරූපණය වන බව ප්‍රවීණයන් එකඟවේ. මානව හිමිකම් නීතිය තවදුරටත් විකාශනය වනවාත් සමඟ රජයන්ට අතිරේක වගකීම් අත්විඳිය හැකි බවද ඔවුන් හඳුනාගනියි. ජාත්‍යන්තර නෛතික සම්මුතීන්ට සමගාමීව යන යෝගියාකාර්ටා මූලධර්මයන්, සියළු රජයන් විසින් එම බැඳීමට අවනත විය යුතු බව තහවුරු කරන්නේ ය.

සියලුම මිනිසුන් නිදහස්ව උපන් අතර ගරුත්වය සහ අයිතිවාසිකම් අතින් සමාන වේ. සෑම මිනිසෙකුටම තමන්ගේ වටිනා ජන්මඋරුමය ඉටු කරගත හැකි වෙනස් අනාගතයක් මොවුන් පොරොන්දුවේ

සෝනියා ඔනුෆර් කොරායා
සම සභාපති

විටිට් මුන්ටාබන්
සම සභාපති

## *ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හා ලිංගික නැඹුරුතාව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රවීනයන්ගේ කණ්ඩායම වන අප,*

### පෙරවදන

ජාති, වර්ණ, කුල ලිංගික, භාෂා, ආගම්, දේශපාලනික හෝ වෙනත් අදහස්, ජාතික හෝ සමාජ පසුබිම, දේපල, උපත හෝ වෙනත් තත්වයන් යන කිසිඳු වෙනස්කමකින් තොරව සෑම මිනිසෙකු සතුව මානව අයිතිවාසිකම් භුක්ති විඳීමේ අයිතිය ඇත්තේ ඔවුන් නිදහස්ව උපන් නිසාත්, ගරුත්වය සහ අයිතිවාසිකම් අතින් සමාන නිසා බව යළි මතකයට නගමු.

ලෝකයේ ඕනෑම ප්‍රදේශයක ජීවත් වන පුද්ගලයෙකුට තම සමාජ-ලිංගික අනන්‍යතාවය හා ලිංගික නැඹුරුතාවය හේතු කොට ගෙන ප්‍රචණ්ඩත්වය, බධාකිරීම, වෙනස්කොට සැලකීම, බැහැර කිරීම, අපකීර්තියට පත්කිරීම සහ අගතියට පත්කරනු ලබන අතරම මෙම ක්‍රියා, ස්ත්‍රී පුරුශ සමාජභාවය, වාර්ගිකත්වය, වයස, කුලය, ආගම, සෞඛ්‍ය, ආබාධිත බව හෝ ආර්ථික සහ සමාජීය කරුණු මත වෙනස් කිරීමේ අත්දැකීම් වලින් සංයුක්ත වන හෙයින්, මෙවැනි ප්‍රචණ්ඩත්වයන්, බධාකිරීම්, වෙනස්කොට සැලකීම්, බැහැර කිරීම්, අපකීර්තියට පත්කිරීම් සහ පූර්ව විනිශචයන් නිසාවෙන්, මෙවැනි අපයෝජනයන්ට ලක්වන පුද්ගලයෙකුගේ ගෞරවය සහ අවංකත්වය අස්ථාවර වන අතරම, ඔවුන්ගේ ස්වයං-වටිනාකම, තම ප්‍රජාව සමඟ ඇති බැඳීම දුර්වල වන අතරම, එමඟින්, බොහෝ දෙනෙකුට තම අනන්‍යතාවයන් සැඟවීමට හෝ යටපත්කරගනිමින්, බියෙන් සහ රහසිගතව ජීවත්වීමට පෙළඹීමෙන් කැළඹී ඇත.

අතීතයේදීද පුද්ගලයන් මානව හිමිකම් කඩකිරීම් වලට ලක් වූයේ ඔවුන් කාන්තා හෝ පුරුෂ සම ලිංගික, බහු ලිංගික නිසා හෝ එසේ යැයි අනුමාන කළ නිසාත්,  සමාන සමාජ ලිංගිකයෙකු සමඟ කැමැත්ත සහිතව ඇතිවන ලිංගික හැසිරීම නිසා හෝ, ඔවුන් අන්තර්ලිංගික හෝ සංක්‍රාන්ති ලිංගික නිසා හෝ එසේ යැයි අනුමාන කළ නිසා හෝ නැතිනම්, සමහර සමාජයන් වල ස්ත්‍රී පුරුශ සමාජභාවයට අනුව හෝ ලිංගික හැඩගැසීමට අනුව අයත්න සමාජ කණ්ඩායමකට අයත්වන නිසා හෝ බව අප දැනුවත් ය.

ස්ත්‍රී-පුරුශ සමාජභාවයෙන් වෙනස් හෝ සාමාන හෝ බහු හෝ වන පුද්ගලයෙකු වෙත ඉතා හැඟීම්බරව, හෘදයාංගමව ආදරය කිරීමට, ලිංගිකව ආකර්ශනය වීමට සහ අතිශයින්ම සමීප ලිංගික සම්බන්ධතාවයක් පැවැත්වීමට ඇති හැකියාව ලිංගික නැඹුරුතාව බව අවබෝධව ඇත.

උපතින් ලැබූ ලිංගිකය සමඟ සමාන හෝ නොසමාන වුවත් පුද්ගලයෙකුට ගැඹුරින් දැනෙන සහ අත්දකින්නාවූ සමාජ ලිංගිකත්වය මෙන්ම, තමන්ගේ ශරීරය පිළිබඳව ඇති හැඟීම, (ශාරීරික අවයවයන්, බාහිර පෙනුම හෝ ශාරීරික ක්‍රියාකාරීත්වයන්, වෛද්‍ය හෝ සැත්කම් හෝ වෙනත් ආකාරයන් ගෙන් සිය කැමැත්තෙන් වෙනස් කරගැනීම යන්නද අයත් විය හැක) සහ ඇඳුම් පැලඳුම්, කතාබහ සහ හැසිරීම් චර්යා රටාවන් සහ ඇවතුම් පැවතුම් වැනි සමාජ ලිංගිකත්වය හඟවන වෙනත් ප්‍රකාශයන්ද සමාජ ලිංගිකත්ව අනන්‍යතාවයට ඇතුළත් වන බව අවබෝධව ඇත.

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය කවරක් වුවත්, සැම පුද්ගලයෙකුටම සියලුම මානව හිමිකම් පූර්ණ වශයෙන් භුක්තිවිඳීමේ අයිතිය ජාත්‍යන්තර මානව හිමිකම් නීතීන් තුළින් තහවුරු කරන අතරම, දැනට පවත්නා මානව හිමිකම් වරප්‍රසාද ක්‍රියාවට නැඟීමේදී, වෙනස් ලිංගික නැඹුරුතාව සහ සමාජ-ලිංගික අනන්‍යතාවයන් ඇති පුද්ගලයින්ගේ නිශ්චිත තත්වයන් සහ අත්දැකීම් සැලකීමට ගතයුතු බවත්, ළමයින් සම්බන්ධව ගන්නා සෑම ක්‍රියාවකදීම ළමයාගේ යහපැවැත්මට ප්‍රමුඛත්වය ලබාදිය යුතු බව සහ අදහස් ප්‍රකාශකිරීමට හැකි ළමයින්ට අදහස් නිදහස්ව ප්‍රකාශ කිරීමට අයතිය ඇති බවත්, එම අදහස්



ළමයාගේ වයස සහ මුහුකුරත්වය අනුව මැන බැලීම තහවුරු කරන බව නිරීක්ෂණය කරන්නෙමු.

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය විසින් සිවිල්, සංස්කෘතික, ආර්ථික, දේශපාලනික සහ සමාජීය යන සියලුම මානව හිමිකම් පූර්ණව භුක්තිවිඳීමේ අයිතියට වෙනස්කම් කිරීම, සම්පූර්ණයෙන්ම තහනම් කරවයි. කාන්තාව සහ පිරිමියා අතර සමානාත්මතාවය ඇති කරවීමට සියලුම ලිංගික අයිතීන්, ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ ලිංගික අනන්‍යතාවයන්ට ගෞරව කිරීම අනිවාර්ය කරවන අතර, රාජ්‍යය විසින්, එක් ලිංගිකයක උත්තරීතරත්වය හෝ  ගැහැණිය සහ පිරිමියාගේ ආකෘතිගත භූමිකාවන්, තහවුරු කරන්නාවූ අගතිගාමී පූර්ව විනිශ්චයන් සහ සිරිත් විරිත් නැතිකරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගත යුතු බව දක්ව යි. ජාත්‍යන්තර ප්‍රජාව පුද්ගලයෙකුට තම ලිංගික සහ ප්‍රජනන  සෞඛ්‍ය ද ඇතුළුව තම ලිංගිකත්වය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් පෙළඹවීම්, වෙනස්කිරීම් සහ ප්‍රචණ්ඩත්වයෙන් තොරව, වගකීම්සහගතවව සහ නිදහස්ව තීරණ ගැනීමේ අයතිය හඳුනාගෙන ඇති බව දක්වන්නෙ මු.

විවිධ ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයන්ගේ ජීවිත සහ අත්දැකීම් වලට උචිත ලෙස ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය ක්‍රමවත් හා නිරවුල්  ආකාරයකින් දැක්වීමේ වැදගත්කම හඳුනාගෙන ඇත්තෙමු.

මෙම ක්‍රමවත් පෙළගැස්ම පවතින ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය තත්වය මත පදනම් විය යුතු බව සහ එම නීතියේ වෙනස් වීම් සැළකිල්ලට ගැනීමටත්, කලාපීය සහ කාලීනව විවිධ ලිංගික හැඩගැසීම් සහ සමාජ ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයන්ගේ ජීවිත සහ අත්දැකීම් වල ඇති වන වෙනස් වීම් වලට යෝග්‍ය වන පරිදි නිරතුරුව වෙනස් විය යුතු බවත්  පිළිගන්නෙමු.

*2006 නොවැම්බර් මස 06 සිට 09 වන දින දක්වා*
*ඉන්දුනීසියාවේ යෝගියාකාර්ටා නුවර*
*පැවති ප්‍රවීණයන්ගේ සමුළුවෙන් අනතුරුව මෙම මූලධර්මයන්*
*සම්මත කරගන්නා ලදී.*

මූලධර්ම

## 1 විශ්ව මානව හිමිකම් භුක්ති විඳීමේ අයිතිය.

සියළුම මනුෂ්‍යයෙකුම නිදහස්ව උපන් හෙයින් ගරුත්වය සහ අයිතිවාසිකම් අතින් සමානයෝ වෙති. සියලුම ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ ලිංගික අනන්‍යතාවයන්ට අයත් මනුෂ්‍යයන්ට සියළුම මානව හිමිකම් සම්පූර්ණයෙන් භුක්තිවිඳීමේ අයිතිය ඇත.

රාජ්‍යයන් විසින්:

1. සියලුම මානව හිමිකම් වල පවතින්නාවූ විශ්වීයත්වය, අන්තර්සම්බන්ධතාවය, එකිනෙක හා බැඳුනු ස්වභාවය, නොබෙදිය හැකි බව, යන ප්‍රතිපත්තීන් ජාතික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ හෝ වෙනත් යෝග්‍ය නීති පද්ධතීන් තුළ මූර්තිමත් කළ යුතු අතරම, සියලුම මානව හිමිකම් ප්‍රායෝගිකව සාක්ෂාත්කරගැනීම

2. අපරාධ නිතියද ඇතුළුව ඕනෑම නීති පද්ධතියක් සියලුම මානව හිමිකම් භුක්ති විඳීමේ විශ්වීය අයිතිය සමඟ සංගත වන ආකාරයෙන් සංශෝධනය කිරීම

3. සමාජ-ලිංගික අනන්‍යතාවය හෝ නැඹුරුතාවයන් මත නොසලකා හැරීම් වලින් තොරව සෑම පුද්ගලයෙකුටම සියළුම මානව හිමිකම් භුක්ති විඳීමේ අයිතිය පිලිබඳව දැනුවත් කිරීමේ සහ අවබෝධය ලබාදීමේ වැඩසටහන් දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

4. සමාජ-ලිංගික අනන්‍යතාවයන් හා නැඹුරුතාවයන් ද ඇතුළත්ව මානව අනන්‍යතාවයන්ගේ සියලුම අංශයන්ගේ අන්තර්සම්බන්ධතාවය සහ නොබෙදිය හැකි බව හඳුනාගන්නා සහ තහවුරු කරන්නාවූ බහුවිධ ප්‍රවේශයක් රාජ්‍ය ප්‍රතිපත්ති හා තීරණ ගැනීම් තුළට ඒකාබද්ධ කරගත යුතු ය.

මූලධර්ම

## 2 සමානාත්මතාවය විඳීමේ සහ නොවෙනස් ලෙස සැලකුම් ලැබීමේ අයිතිය.

ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම් වෙනස්කම් වලින් තොරව සියලුම මානව හිමිකම් භුක්ති විඳීමේ අයිතිය සෑම පුද්ගලයා සතුවේ. වෙනත් පුද්ගලයෙකුගේ මානව අයිතිවාසිකම් භුක්තිවිඳීම අහිමි වුවද, නැතද, කිසිඳු ආකාරයේ වෙනස්කමකින් තොරව සෑම පුද්ගලයෙකුටම නීතිය හමුවේ සමානාත්මතාවයද නීතියේ සමාන රැකවරණයද හිමිවිය යුතු ය. නීතිය මඟින් මෙවැනි අසාධාරණයන්, තහනම් කර එවන් අසාධාරණයන් හමුවේ සෑම පුද්ගලයෙකුටම සමාන සහ විධිමත් රැකවරණයක් ලබා දිය යුතු වේ.

නීතිය ඉදිරියේ සමානාත්මතවය හෝ නිතිය හමුවේ සමාන රැකවරණය හෝ සියලුම මානව අයිතිවාසිකම් සහ මූලික නිදහස සමාන පදනමක් මත හඳුනාගැනීම, භුක්තිවිඳීම හෝ ක්‍රියාවේ යෙදවීමට ඇති අයිතිය හෝ හානි කරවන හෝ අවලංගු කරවන, හෝ අරමුණු හෝ බලපෑම් ඇති ලිංගික නැඹුරුතාවයන් හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම්ව වෙන්කොට හඳුනාගැනීම, කොන්කිරීම, සීමා කිරීම හෝ තෝරාගැනීම්, ලිංගික නැඹුරුතාවයන් හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම් වන අසාධාරණයන්ට අයත් වේ. ලිංගික හැඩගැසීම් හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම් වන අසාධාරණයන් තුළට වාර්ගිකත්වය, වයස, කුලය, ආගම, ආබාධිත බව හෝ ආර්ථික සහ සමාජීය ද ඇතුළත්ව වෙනත් තත්වයන් මත පදනම්ව කෙරෙන ප්‍රචණ්ඩත්වයන් සංයුක්තව වීම බොහෝ අවස්ථාවන්හිදී සිදුවන සහ සිදුවිය හැකි තත්වයකි.

රාජ්‍යයන් විසින්:

1. සමානාත්මතාවයේ සහ ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම්ව නොවෙනස්ව



සැළකීමේ මූලධර්මයන් සිය ජාතික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ට හෝ වෙනත් යෝග්‍ය නීති පද්ධතීන් වලට අන්තර්ගත කලයුතුය. මේවන විට එසේ ඇතුළත් කර නැතිනම්, සංශෝධනයක් සහ නිර්වචනයන් තුළින් එය ඇතුළත් කළ යුතු වන අතරම මෙම මූලධර්මයන් සාර්ථකව ළඟාකරගැනීම සහතික කළ යුතු වේ.

2. නීත්‍යානුකූල සම්මතික විය පසුකළ පුද්ගලයෙක් තම ඒකමතිකත්වයෙන් පවත්න සමාන ලිංගික සම්බන්ධතාවයන් පැවැත්වීම තහනම් කරවන හෝ ක්‍රියාත්මක කරවන්නාවූ අපරාධ නීතීන් සහ වෙනත් නෛතික ප්‍රතිපාදනයන් තහනම් කළ යුතු අතරම ලිංගික කටයුතු සඳහා එකඟවන්නාවූ නීත්‍යානුකූල සම්මතික වයස සමාන-ලිංගික, වෙනස්-ලිංගික සහ විශම-ලිංගික සම්බන්ධතාවයන් සියල්ලටම සමානවීම සහතික කළ යුතු ය.

3. මහජන සහ පෞද්ගලික ප්‍රදේශයන් හි සිදුවන ලිංගික නැඹුරුතාවයන් හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම්ව සිදුවන අසාධාරණයන් තහනම් කිරීමට සහ තුරන්කිරීමට අදාල ව්‍යවස්ථාදායක සහ වෙනත් ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.

4. විවිධ ලිංගික නැඹුරුතාවයන් හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයන් හෝ කණ්ඩායම් හට මානව හිමිකම් භුක්තිවිඳිම සහ භාවිතයේ යෙදීම සහතික කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් සංවර්ධනීය ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.

5. ලිංගික නැඹුරුතාවයන් හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් මත පදනම්ව සිදුකෙරෙන්නාවූ සියලුම අසාධාරණයන් ට දක්වන්නාවූ සියලුම ප්‍රතිචාරයන් තුළින් අනෙක් අසාධාරණයන් සමඟ මෙම වෙනස්කොට සැළකීම බද්ධ වන ආකාරය සැළකිල්ලට ගත යුතු ය.

6. ලිංගික නැඹුරුතාවයන් හා සමාජ-ලිංගික අනන්‍යතාවයන් හෝ සමාජ-ලිංගික ප්‍රකාශනයන් ගේ උසස් හා පහත් බව, සම්බන්ධයෙන් ඇති අගතිගාමී හෝ වෙන්කොට සැළකීමේ ආකල්පයන්, හැසිරීම් පිටුදැකීමේ අරමුණින් අධ්‍යාපනික හා පුහුණුකිරීම් වැඩසටහන් ඇතුළුව යෝග්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

මූලධර්ම

## නීතිය ඉදිරියේ පිළිගැනීමේ අයිතිය 3

ඕනෑම පුද්ගලයෙකුට ඕනෑම තැනකදී පුද්ගලයෙකු වශයෙන් නීතිය ඉදිරියේ පිළිගැනීමේ අයිතියක් ඇත. විවිධ ලිංගික නැඹුරුතාවයන් හෝ සමාජ-ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයන්ටද තම ජීවිතයේ සියලුම පැතිමානයන් තුළ නෛතික ධාරිතාව භුක්තිවිඳීමේ අයිතිය ඇත. සෑම පුද්ගලයෙකුගේම තමන් විසින්ම හඳුනාගනු ලබන ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ-ලිංගික අනන්‍යතාව පුද්ගලයාගේ පෞරුෂයට, අනුකලනය වන අතරම එය ආත්ම-අධිෂ්ඨානය, ගෞරවය සහ නිදහසෙහි මූලික පාර්ශවයන් වේ. තමන්ගේ සමාජ-ලිංගික අනන්‍යතාවයේ නෛතික තහවුරුභාවය සඳහා කිසිම පුද්ගලයෙකුව ලිංගිකය යළි-පැවරීමේ ශල්‍යකර්ම, ස්ථිර උපත්පාලන ක්‍රම (වඳභාවය), හෝ හෝමෝන ප්‍රතිකර්ම ද ඇතුළුව වෛද්‍ය ප්‍රතිකර්මයන් සඳහා බල නොකළ යුතු ය. පුද්ගලයෙකුගේ සමාජ-ලිංගික අනන්‍යතාවයේ නෛතික පිළිගැනීම වැළැක්වීම සඳහා විවාහය හෝ දෙමව්පියභාවය, වැනි කිසිඳු තත්වයක පිහිට පැතීම නොකළ යුතු ය. කිසිදු පුද්ගලයෙකුට තම ලිංගික නැඹුරුතාව හෝ සමාජ-ලිංගික අනන්‍යතාව සැඟවීමට හෝ නොපිළිගැනීමට, බලකිරීම නොකළ යුතු ය.

රාජ්‍යයන් විසින්:

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව මත වෙනස්කිරීමකින් තොරව සෑම පුද්ගලයෙකුටම සිවිල් කරුණු වලදී නෛතික ධාරිතාව ලබා දිය යුතු අතරම ගිවිසුම් නිගමනය කිරීමට සමාන අයිතිවාසිකම් සහ දේපල අයිතිය, පරිපාලනය, අත්පත් කරගැනීම (උරුමයෙන් ලැබෙන දේපලද ඇතුළුව),

කළමනාකරණය, භුක්ති විඳීමට සහ ඉවත් කිරීමද ඇතුළුව එම ධාරිතාව භාවිතා කිරීමට අවස්ථාවද සහතික කළ යුතු වේ.

2. සෑම පුද්ගලයෙකුගේම ස්වයං-නිර්වචනය කළ සමාජ-ලිංගික අනන්‍යතාවයට පූර්ණ ගෞරවය ලැබීමට සහ නෛතිකව පිළිගැනීමට අවශ්‍ය වන්නාවූ සියලුම ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ වෙනත් ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.

3. පුද්ගලයෙකුගේ සමාජ-ලිංගිකය/ලිංගිකය සඳහන් කරන උප්පැන්න සහතික, විදේශ ගමන් බලපත්‍ර, ඡන්ද පත්‍රිකා සහ අනෙක් වාර්තාවන් ද ඇතුළුව රජය විසින් නිකුත් කරන්නාවූ සියලුම හැඳුනුම්පත් තුළ ස්වයං-නිර්වචනය කළ සමාජ-ලිංගික අනන්‍යතාවය පිළිඹිබු කිරීමට අවශ්‍ය සියලුම ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ වෙනත් ක්‍රියාමාර්ගයන් ගැනීම සහතික කළ යුතු ය.

4. මෙම ක්‍රියාමාර්ගයන්, කාර්යක්‍ෂම, සාධාරණ සහ වෙනස්කම් කිරීමට ලක්නොවිය යුතු මෙන්ම අදාල පුද්ගලයාගේ අභිමානයට සහ පෞද්ගලිකත්වයට ගරුකිරීම සහතික කළ යුතු ය.

5. නීතීන් හෝ ප්‍රතිපත්තීන් විසින් පුදගලයෙකුගේ සමාජ-ලිංගික අනන්‍යතාවය අනුව හඳුනාගැනීම හෝ වෙන්කිරීම ඉල්ලා සිටින අවස්ථාවන්හිදී සමාජ-ලිංගික අනන්‍යතාවය වෙනස් කරනු ලැබූ හැඳුනුම්පතේ පිළිගැනීම සෑම සන්දර්භයක් තුළම තහවුරු කළ යුතු ය.

6. සමාජ-ලිංගික අනන්‍යතා සංක්‍රාන්තිය හෝ යළි-පැවරීම අත්දකින ලබන සියලුම පුද්ගලයන්ට සමාජ දයකත්වය ලබා දෙන්නාවූ සැලසුම් සහගත වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වේ.

මූලධර්ම

## 4 ජීවිතයට ඇති අයිතිය

සෑම පුද්ගලයෙකුටම ජීවිතයට අයිතිය ඇත. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවන් සැලකිල්ලට ගෙන කරන සඳහන්ද ඇතුළුව කිසිම පුද්ගලයෙකුගේ ජීවිතය අහිමිකිරීමට නොහැක්කේය. නීත්‍යානුකූල සම්මතික විය පසුකළ පුද්ගලයෙක් තම ඒකමතිකත්වයෙන් පවත්වන ලිංගික සම්බන්ධතාවයන් මත හෝ ලිංගික හැඩගැසීම හෝ සමාජ-ලිංගික අනන්‍යතාවන් මත මරණීය දණ්ඩනය නියම නොකළ යුත්තේය.

රාජ්‍යයන් විසින්:

1. නීත්‍යානුකූල සම්මතික විය පසුකළ පුද්ගලයෙක් ඒකමතිකත්වයෙන් පවත්වන සමාන-ලිංගික සම්බන්ධතාවයන් තහනම් කිරීම අරමුණු කරගත් හෝ එසේ බලපෑම් කරවන්නාවූ අපරාධ නීතීන් තහනම් කළ යුතු අතරම එසේ නෛතික ප්‍රතිපාදනයන් තහනම් කෙරෙන තුරු එවැනි වගන්ති යටතේ වරදකරුවන් වන පුද්ගලයන්ට මරණීය දණ්ඩනය නොපැමිණවිය යුත්තේ ය.

2. නීත්‍යානුකූල සම්මතික විය පසුකර ඒකමතිකත්වයෙන් පැවැත්වූ ලිංගික සම්බන්ධතාවයන් හේතුවෙන්, මරණීය දණ්ඩනයට නියම වී ඇති සියලුම පුද්ගලයන් ලත් විනිශ්චයන් අවලංගු කර නිදහස් කළ යුත්තේ ය.

3. රාජ්‍ය-අනුග්‍රහය හෝ රාජ්‍ය-ඉවසීම මත ලිංගික නැඹුරුතාවය හා අනන්‍යතාවය මත පදනම්ව පුද්ගලයන්ගේ ජීවිතයට කරන්නාවූ ඕනෑම ප්‍රහාරයන් වලකාලිය යුතු අතර එවැනි ප්‍රහාරයන් ලක් කරන සෑම අවස්ථාවක්ම ඉතාමත් තදින් පරීක්ෂා කර යෝග්‍ය සාක්ෂි ඇති සෑම විටක රජයේ නිලධාරියෙකු හෝ ඕනෑම පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් හෝ වේවා වගකිව යුතු පුද්ගලයන් වෙත නඩු පවරා, විනිශ්චය ලබා දී දඬුවම් පැමිණිය යුත්තේ ය.



මූලධර්ම

## පුද්ගල රැකවරණය සඳහා ඇති අයිතිය 5

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව කවරක් වුවද සෑම පුද්ගලයෙකුටම රාජ්‍ය නිළධාරීන් හෝ ඕනෑම පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් සිදුකරන්නාවූ ප්‍රචන්ඩ ක්‍රියා හෝ ශාරීරික වධදීම් වලින් ආරක්‍ෂා වීමට සහ රජයේ රැකවරණය ලැබීමට අයිතිය ඇත්තේ ය.

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවයන්ට අදාලව සිදුකරන්නාවූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් හා හිංසනයන් ගෙන් ආරක්‍ෂා කිරීමට අවශ්‍ය සියලුම ප්‍රතිපත්තීන් හා වෙනත් ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.

2. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම්ව පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩා-යමකට, ඔවුන්ගේ පවුලද ඇතුළුව ජීවිතයේ සියලුම පැතිමානයන්ට එරෙහිව සිදුකරනු ලබන පුචණ්ඩ ක්‍රියා, බියගැන්වීම්, ප්‍රචණ්ඩත්වයට පෙලඹවීම්, සහ අදාල හිංසනයන් සඳහා අපරාධ දඬුවම් ලබා දීමට අවශ්‍ය ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ගයන් ගත යුතු ය.

3. එවැනි ප්‍රචණ්ඩත්වයන් සාධාරණීයකරණය කිරීමට, අවතක්සේරු කිරීමට හෝ සමාව දීමට පැමිණිලිකරුවාගේ (අසාධාරණයට ලක්වූවන්) ලිංගික හැඩගැසීම හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය හේතුවක් ලෙස දැක්වීම වැලැක්වීමට අවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ වෙනත් යෝග්‍ය නිර්දේශයන් ගත යුතුය.

4. මෙවැනි ප්‍රචණ්ඩත්වයන් හි වරදකරුවන්ව ප්‍රබලව පරීක්‍ෂණයට ලක්කර, යෝග්‍ය සාක්ෂි ලත් විටෙක, චූදිතයන් විනිශ්චය කර දඬුවම් ලබා දිය යුතු අතරම වන්දීන් ඇතුළුව යෝග්‍ය නිවැරදි කිරීම් සහ පිළියම් පැමිණිලිකරුවාට (අසාධාරණයට ලක්වූවන්) ලබා දිය යුතු ය.

5. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවයට අදාල වන්නාවූ ප්‍රචණ්ඩත්වයන් යටින් දිවෙන අගතිවාදී පූර්ව විනිශ්චයන් පිටුදැකීමට පොදු ජනතාවට මෙන්ම ප්‍රචණ්ඩත්වයේ වරදකරුවන් හෝ වරදෙහි බැඳිය හැක්කන් ඉලක්ක කොට, දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

මූලධර්ම

## පෞද්ගලිකත්වයට ඇති අයිතිය 6

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය කවරක් වුවද, සෑම පුද්ගලයෙකුටම තමන්ගේ පවුල, නිවස, හෝ සන්නිවේදනයන් ද ඇතුළුව අත්තෝමතික හෝ අවසර මැදහත් වීම් වලින් තොරව පෞද්ගලිකත්වය භුක්තිවිඳීමේ අයිතිය ඇත්තා සේම ඔවුන්ගේ ගෞරවය සහ අභිමානයට තර්ජනයන් එල්ලවන අවස්ථාවන්හිදී රැකවරණය සඳහා අයිතිය ලැබිය යුත්තේ ය. තම ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිරාවරණය කිරීම හෝ නොකිරීම මෙන්ම තමන්ගේ ශරීරය පිළිබඳ තීරණ සහ තෝරා ගැනීම සහ ඒකමතිකත්වයෙන් ලිංගික හෝ වෙනත් සම්බන්ධතාවයන් පැවැත්වීම ද පුද්ගලිකත්වයට ඇති අයිතියට ඇතුළත් වේ.

රාජ්‍යයන් විසින්:

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය කවරක් වුවද, සෑම පුද්ගලයෙකුටම, පුද්ගලික ජීවිතය, සමීපතම තීරණ ගැනීමට, සහ නීත්‍යානුකූල සම්මතික විය පසුකළ පුද්ගලයෙක් ඒකමතිකත්වයෙන් පවත්නා ලිංගික සම්බන්ධතාවයන් ද ඇතුළුව මානව සම්බන්ධතාවයන් පැවැත්වීමට කිසිඳු අනවසර මැදිහත්වීමකින් තොරව භුක්ති විඳීමේ අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය සහ වෙනත් ක්‍රියාමාර්ගයන් ගත යුත්තේ ය.

2. නීත්‍යානුකූල සම්මතික විය පසුකළ පුද්ගලයෙක් තම ඒකමතිකත්වයෙන් පවත්නා සමාන ලිංගික සම්බන්ධතාවයන් පැවැත්වීම සාපරාධී කරවන්නාවූ නීතීන් තහනම් කළ යුතු අතරම ලිංගික කටයුතු සඳහා එකඟවන්නාවූ නීත්‍යානුකූල සම්මතික වයස සමාන-ලිංගික, වෙනස්-ලිංගික, ලිංගික සම්බන්ධතාවයන් සියල්ලටම සමානවීම සහතික කළ යුතු ය.

3. සාපරාධී සහ වෙනත් නීතිමය ගිවිසුම් වලට නීත්‍යානුකූල සම්මතික විය පසුකළ පුද්ගලයෙක් තම ඒකමතිකත්වයෙන් පවත්න සමාන ලිංගික සම්බන්ධතාවයන්ට ඇතුලත් නොකිරීමට යථාර්ථවාදී විය යුතුය.

4. ලිංගික අනන්‍යතාවයන් ඇඳුම් පැලඳුම්, හැසිරීම්, කතාබහ මඟින් හෝ ප්‍රකාශමාන කිරීම හෝ තම සමාජ ලිංගික අනන්‍යතාවය ප්‍රකාශ කිරීමක් ලෙස ශරීරයට වෙනස්කම් කිරීමේ අවස්ථාවන් තහනම් කරවන සහ සාපරාධී ලෙස සලකන්නාවූ නීතීන් ඉවත් කල යුතුය.

5. නීත්‍යානුකූල සම්මතික විය පසුකළ පුද්ගලයෙක් තම ඒකමතිකත්වයෙන් පවත්වන සමාන ලිංගික සම්බන්ධතාවයන් පැවැත්වීම හෝ සමාජ ලිංගික අනන්‍යතාවය පදනම් කරගෙන අත් අඩංගුවට ගත් හෝ බන්ධනාගාර ගතකොට සාපරාධී වරදකරුවන් කර ඇති පුද්ගලයන් සියලුදෙනාම නිදහස් කළ යුතුය.

6. සාමාන්‍ය පුද්ගලයෙකුට තම ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය පිලිබඳ තොරතුරු කවදා, කා හට, කෙසේ අනාවරණය කරන්නේද යන අයිතිය ඇති අතරම සියලුම පුද්ගලයන්ව අත්තනෝමතික හෝ අනවශ්‍ය හෙළිදරව් කිරීමට හෝ හෙලිදරවු කරන බවට අන් අය කරනු ලබන තර්ජනය කිරීම් වලින් ඔවුන් ආරක්‍ෂා කිරීම සහතික විය යුතුය.

## මූලධර්ම 7 අත්තනෝමතිකව ස්වාධීනත්වය අහිමිකිරීමෙන් නිදහස් වීමේ අයිතිය

කිසිවෙකු අත්තනෝමතික ලෙස අත්-අඩංගුවට ගැනීමට හෝ රඳවා තබා ගැනීමට ලක් නොවිය යුතුය. පුද්ගලයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය හේතුවක් කරගෙන එසේ කළ නොහැක. අධිකරණ නියෝගයක් හෝ එවැන්නක් නොමැතිව පුද්ගලයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා අත්-අඩංගුවට ගන්නේ හෝ රඳවා තබා ගන්නේ නම් එය අත්තනෝමතික ක්‍රියාවකි. අත් අඩංගුවට පත් වූ ඕනෑම පුද්ගලයෙකු ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය කුමක් වූවද අපරාධයකට එසේම චෝදනා ලබා තිබුණත් නැතත් සමානාත්මතා පදනමින් උරුම වූ පරිදි, ඔවුන් අත් අඩංගුවට ගත් හේතුවත්, චෝදනාවල ස්වභාවයත් ඔවුන්ට දැන්විය යුතු අතර, වහාම නෛතික නිලධාරියෙක් වෙත පමුණුවා අධිකරණමය ක්‍රියාමාර්ගයන් මඟින් අත්-අඩංගුවට ගැනීමේ නීත්‍යානුකූල බව සහතික කල යුතුය.

රාජ්‍යයන් විසින්:

1. වෙනස්කම් කිරීමේ භාවිතයන්ට හෝ අගතිවාදී පූර්ව විනිශ්චයන් මත පදනම්ව අත්-අඩංගුවට ගැනීම්වලට අවකාශය සපයන නොපැහැදිලි වචනවලින් යුත් අපරාධ නීති විධිවිධාන බැහැර කිරීම ද ඇතුළුව ඕනෑම තත්වයක දී අත් අඩංගුවට ගැනීමේ හෝ රඳවා තබා ගැනීමේ හේතුව බවට ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය පත් නොවන පරිදි සියළුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. අත් අඩංගුවට පත් වූ ඕනෑම පුද්ගලයෙකු ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය කුමක් වූවද අපරාධයකට එසේම චෝදනා ලබා තිබුණත් නැතත් සමානාත්මතා පදනමින් උරුම වූ පරිදි, ඔවුන් අත් අඩංගුවට ගත් හේතුවත්, චෝදනාවල ස්වභාවයත් ඔවුන්ට දැන්විය යුතු අතර, වහාම නෛතික නිලධාරියෙක් වෙත පමුණුවා අධිකරණමය ක්‍රියාමාර්ගයන් මඟින් අත් අඩංගුවට ගැනීමේ නීත්‍යනුකූල බව සහතික කිරීම වෙනුවෙන් අවශ්‍යවන සියළුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

3. පුද්ගලයෙකු ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම්ව අත් අඩංගුවට ගැනීමේ හා රඳවා ගැනීමේ අත්තනෝමතිකත්වයට අදාලව පොලීසිය සහ නීති බලාත්මක නිළධාරීන් පුහුණු කිරීමේ සහ ඔවුන්ගේ සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය;

4. අත්අඩංගුවට ගත් සහ රඳවා ගත් පුද්ගලයින්ගේ නිරවද්‍ය යාවත්කාලීන වාර්තාවන් නඩත්තු කළ යුතු අතර, එහි දිනය, ස්ථානය සහ රඳවා ගැනීමට හේතු යනාදිය අඩංගු විය යුතුය. එමෙන්ම ඇතැම්විට පුද්ගලයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා අත් අඩංගුවට ගැනීමට සහ රඳවා ගැනීමට පෙළඹවී ඇත්දැයි යන්න හඳුනා ගැනීමට තරම් ප්‍රමාණවත් බලයක් සහ සූදානමක් ඇති අධිකාරීත්වයක් විසින් අත් අඩංගුවේ සියළුම ස්ථානයන්ගේ ස්වාධීන අවධානයක් සහතික කළ යුතුය;

## මූලධර්ම 8 සාධාරණ විනිශ්චයක් ලැබීමේ අයිතිය

නීතිය මගින් ස්ථාපිත කළ සුදුසුකම් සපිරූ, ස්වාධීන සහ අපක්ෂපාතී අධිකරණයක් ඉදිරියේ සාධාරණ වූ ප්‍රසිද්ධ නඩු විභාගයක් ලැබීමට සෑම දෙනෙකුම හිමිකම් කිය යි. තමන්ගේ අයිතීන් සහ බැඳීම් නිශ්චය කෙරෙන තමන්ට එරෙහි වූ ඕනෑම අපරාධ චෝදනාවක දී සහ නීතියේ නඩුවක දී සමාජ-ලිංගික අනන්‍යතාවය හා ලිංගික නැඹුරුතාවයන් මත පදනම් වූ අගතියකින් තොරව හා වෙනස්කමකින් තොරව ඔවුන්ට එරෙහිව සාපරාධී චෝදනා ඉදිරිපත්වන අවස්ථාවක දී ඊට එරෙහිව ඔවුන්ගේ අයිතීන් විනිශ්චය කර ගැනීමට හා ඒ වෙනුවෙන් බැඳී සිටීමට ද පුද්ගලන්ට අයිතියක් ඇත.

රාජ්‍යයන් විසින්:

1. තමන්ගේ අයිතීන් සහ බැඳීම් නිශ්චය කෙරෙන අධිකරණ ක්‍රියාවලියේ සෑම මට්ටමක දීම, සිවිල් සහ අපරාධ නඩු විභාගයන් සහ අනෙක් සියළුම අධිකරණමය සහ පරිපාලනමය නඩු විභාගයන් වල දී ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම් වූ අගතිගාමී සැළකීම් තුරන් කිරීමට සහ පාර්ශවයක්, සාක්ෂිකරු හෝ තීරකයා ලෙස අපවාදී සැක කිරීමට ලක් නොවන පරිදි සියළුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත සම්පූර්ණයෙන්ම හෝ පාර්ශවීයව අභිප්‍රේරිත අපරාධ චෝදනා හෝ සිවිල් නඩු විභාගයන්ගෙන් පුද්ගලයින් ආරක්ෂා කර ගැනීමට අත්‍යාවශ්‍ය සහ යුක්ති සහගත පියවරයන් සියල්ල ගත යුතුය;

3. පුද්ගලයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය ද ඇතුළුව සමානාත්මතාවය සහ පූර්ව අගති විරහිතබවෙහි අන්තර් ජාතික මානව අයිතීන් ප්‍රමිතීන් සහ මූලධර්ම විනිශ්චයකරුවන්ගේ, අධිකරණ නිලධාරීන්ගේ, අභිචෝදකයින්ගේ නීතිඥයින්ගේ සහ අනෙකුත් අයගේ සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය;

## මූලධර්ම 9 වදහිංසා සහ කෲර අමානුෂික හෝ ආත්ම ගෞරවය කෙළෙසන සැළකීම් හෝ දඬුවම්වලින් නිදහස්වීමේ අයිතිය.

ලිංගික නැඹුරුතාවය හා ලිංග අනන්‍යතාවය සම්බන්ධ ඒවා ද ඇතුළත්ව වද දීම්වලින් සහ කෲර අමානුෂික හෝ ආත්ම ගෞරවය කෙළෙසන සැළකීම් හෝ දඬුවම්වලින් නිදහස් වීමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත.

රාජ්‍යයන් විසින්:

1. තමන්ගේ අයිතීන් සහ බැඳීම් නිශ්චය කෙරෙන අධිකරණ ක්‍රියාවලියේ සෑම මට්ටමක දීම, සිවිල් සහ අපරාධ නඩු විභාගයන් සහ අනෙක් සියලුම අධිකරණමය සහ පරිපාලනමය නඩු විභාගයන් වලදී ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම් වූ අගතිගාමී සැළකීම් තුරන් කිරීමට සහ පාර්ශවයක්, සාක්ෂිකරු හෝ තීරකයා ලෙස අපවාදී සැක කිරීමට ලක් නොවන පරිදි සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදායක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාවය සම්බන්ධ ඒවා ද ඇතුළත්ව වද දීම් වලින් සහ කෲර අමානුෂික හෝ ආත්ම ගෞරවය කෙළෙසන සැළකීම් හෝ දඬුවම්වලින් නිදහස් වීමට සෑම පුද්ගලයෙකුටම අයිතියක් ඇත;

3. ඔවුන්ගේ ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාවයට යෝග්‍ය පරිදි රැඳවීමේ ස්ථානය පිළිබඳ තීරණ ගැනීමේ දී හැකි තරම් දුරට සියලුම සිරකරුවන්ගේ සහභාගීත්වය ලබා ගැනීම පිළිබඳව සහතික විය යුතුය;

4. ඔවුන්ගේ ලිංගික හැඩගැස්ම, සමාජ-ලිංගික අනන්‍යතාවය හෝ ලිංගික ප්‍රකාශමානය මත පදනම්ව ප්‍රචන්ඩත්වයට හෝ අපයෝජනයට නිරාවරණය වන සියලුම සිරකරුවන්ට සුදුසු ආරක්ෂණ නිර්දේශ යෙදිය යුතුය, ඒ ආරක්ෂණ නිර්දේශ නිසා පොදු සිරකරුවන් ලෙස ඔවුන් බුක්ති විඳින අයිතීන්ට බාධා ඇති නොවිය යුතුය;

5. සියලුම සිරකරුවන්ට හා රැඳවියන්ට හිමි වෛවාහික බැහැ දැකීම් සහකරුවන්ගේ ලිංග බේදයකින් තොරව හිමිවන බවට සහතික විය යුතුය;

6. රාජ්‍ය ආයතන මෙන්ම ලිංගික නැඹුරුතාවය සහ සමාජ-ලිංගික අනන්‍යතාව ක්ෂේත්‍රයේ වැඩ කරන ආයතනද ඇතුළත්ව රාජ්‍ය නොවන ආයතන ද රැඳවීම් ස්ථාන නිරීක්ෂණයට යෙදවිය යුතුය;

7. පුද්ගලයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවයද ඇතුළුව සමානාත්මතාවය සහ පූර්ව අගති විරහිතබවෙහි අන්තර් ජාතික මානව අයිතීන් ප්‍රමිතීන් සහ මූලධර්ම රැඳවීම් ස්ථාන හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රවල සම්බන්ධිත නිලධාරීන්ගේ සහ අනෙකුත් බන්ධනාගාර නිලධාරීන්ගේ සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය;

## මූලධර්ම 10 අත්අඩංගුවට පත් වූ අවස්ථාවක දී මානුෂික ලෙස සැලකීම් ලැබීමේ අයිතිය

නිදහස අහිමි කල ඕනෑම අයෙකුට මානුෂිකව සහ මනුෂ්‍යයෙකු ලෙස උරුම වූ අභිමානයෙන් යුතුව සැළකිය යුතුය. ලිංගික නැඹුරුතාවය සහ සමාජ-ලිංගික අනන්‍යතාවය සෑම පුද්ගලයෙකුගේම අභිමානයේම අන්තර්ගතයකි.



රාජ්‍යයන් විසින්:

1. අත් අංඩගුවේ සිටින විට දී ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම්ව පුද්ගලයන් තව දුරටත්, ආන්තික කිරීමේ හෝ අපරාධයන්ට, පීඩාවන්ට හෝ ශාරීරික, මානසික හෝ ලිංගික අපයෝජනයට ලක්වීමේ අනතුරට භාජනය නොවීමට සහතික විය යුතුය;

2. අත් අංඩගුවේ සිටින අයගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය අනුව පුද්ගලයින්ගේ සුවිශේෂී අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ඔවුන්ගේ ප්‍රජනන සෞඛ්‍යට අදාලව, එච්.අයි.වී./ඒඩ්ස් පිළිබඳ තොරතුරු පරිශීලනය, චිකිත්සාව සහ හෝමෝන පරිශීලනය හෝ අපේක්ෂිත ලිංග-සැකසීම් ද ඇතුළුව ප්‍රතිකාර සඳහා වෛද්‍ය ප්‍රතිකාර සහ උපදේශන පසුකම් ප්‍රමාණවත් ලෙස සැපයිය යුතුය;

3. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ ලිංගික අනන්‍යතාවයට සුදුසු වන පරිදි ඔවුන් රඳවා තබන්නා වූ ස්ථානය පිළිබඳව වන තීරණය ගැනීමට සියළුම සිරකරුවන්ගේ සහභාගීත්වයට හැකි තරම් දුරට සහතික විය යුතුය;

4. නව ආරක්ෂාකාරී ක්‍රියාමාර්ගයන් නිසා සාමාන්‍ය රැඳවියන් දැනටමත් අත්විඳින ඔවුනගේ අයිතීන් තව දුරටත් නොඇහිරෙන පරිදි අත් අඩංගුවේ සිටින අයගේ ලිංගික නැඹුරුතාව, සමාජ-ලිංගික අනන්‍යතාවය හෝ ලිංගික ප්‍රකාශමානය හේතුවෙන් අපරාධවලට හෝ අපයෝජනයට ලක්වීමෙන් ආරක්ෂා කිරීමට සියලුම ආරක්ෂක විධිවිධාන යෙදීමට ප්‍රායෝගිකව සහතික විය යුතුය;

5. සියළුම සිර කරුවන්ට හා රැඳවියන්ට සහකරුවන්ගේ ලිංගිකය ගැන සැළකීමකින් තොරව සමානතා පදනමක් මත අනුමත බැහැදැකීම්වලට සහතික විය යුතුය;

6. රාජ්‍ය සංවිධානවලට ද එමෙන්ම ලිංගික නැඹුරුතාවය සහ සමාජ-ලිංගික අනන්‍යතාව කෙෂ්ත්‍රයේ වැඩකරන සංවිධානයන්ද ඇතුළත් රාජ්‍ය නොවන සංවිධානවලටද රැඳවීම් ස්වාධීනව නිරීක්ෂණය කිරීමේ අවස්ථාවන් ලබා දිය යුතුය;

7. පුද්ගලයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවයද ඇතුලුව සමානාත්මතාවය සහ පූර්ව අගති විරහිතබවෙහි අන්තර් ජාතික මානව අයිතීන් ප්‍රමිතීන් සහ මූලධර්ම පිළිබඳව බන්ධනාගාර නිලධාරීන්ගේ, සහ අනෙක් සියලුම රාජ්‍ය හා පෞද්ගලික නිලධාරීන්ගේ සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය;

## මූලධර්ම 11 සියලුම ආකාරයන්ගේ සූරාකෑමෙන්, මිනිස් කුට්ටනයට ලක්වීමෙන් හා ජාවාරමෙන් ආරක්ෂාවීමට සියලුම දෙනාට අයිතියක් ඇත.

ඇත්ත වශයෙන්ම හෝ පෙනෙන ආකාරයට වන ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා ලිංගික සූරාකෑමටම පමණක් නොව සියලුම ආකාරයන්ගේ සූරාකෑම්වලින්, විකිණීමට ලක්වීමෙන් හා ජාවාර-මෙන් ආරක්ෂාවීමට සැමට අයිතිය ඇත.

ඇත්ත වශයෙන්ම හෝ පෙනෙන ආකාරයට වන ලිංගික නැඹුරුතාවය, සමාජ-ලිංගික අනන්‍යතාවය හෝ වෙනත් අනන්‍යතාවයන්ගේ ප්‍රකාශමානයන් නිසා අනතුරුදායක භාවය වැඩිකරන කරුණු කාරණා වලටද පිළිතුරු දෙන පරිදි මිනිස් ජාවාරම වැළැක්වීමට යොදන නිර්දේශ යෙදිය යුතුය. එමෙන්ම එවැනි නිර්දේශයන් මිනිස් ජාවාරමට ලක්වීමේ අනතුර ඇති පුද්ගලයින්ගේ මානව අයිතිවාසිකම්වලට පටහැනි නොවිය යුතුය.

රාජ්‍යයන් විසින්:

1. ඇත්ත වශයෙන්ම හෝ පෙනෙන ආකාරයට වන ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා ලිංගික සූරාකෑමටම පමණක් නොව සියලුම ආකාරයන්ගේ සූරාකෑම්වලින්, විකිණීමට ලක්වීමෙන් හා ජාවාරමෙන් වැලැක්වීමේ හා ආරක්ෂා වීමේ සියලුම අත්‍යාවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. එම නීතිගත කිරීම් හෝ නිර්දේශයන් නිසා එවන් අනතුරුවලට නිරාවරණය වී ඇති අයගේ හැසිරීම් සාපරාධීබවට ලක් කිරීමක්, අපකීර්තියට ගර්භාවට ලක් කිරීමක් හෝ වෙනත් ආකාරයකින් අවාසිදයක බව වැඩිකිරීමක් සිදු නොවන බවට සහතික විය යුතුය.

3. ඇත්ත වශයෙන්ම හෝ පෙනෙන ආකාරයට වන ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා සමාජීය පිටමං කිරීම, වෙනස්කම් කොට සැළකීම, පවුලෙන් හෝ සංස්කෘතික ප්‍රජාවෙන් පිටමං කිරීම, මූල්‍යමය ස්වාධිනතාවය අහිමි වීම, නිවාස අහිමිවීම, ආත්ම අභිමානය අඩුවීමට හේතුවන නිවාසවලට-නාවාතැන්ගැනීමට-රැකියාවට සහ සමාජීය සේවාවන්ට ළඟාවීමට නොහැකිවන පරිදි සිදුවන වෙනස්කම් කිරීමේ සමාජීය ආකල්ප වැනි දේවල්ද ඇතුළුව ලිංගික සූරාකෑමටම පමණක් නොව සියලුම ආකාරයන්ගේ සූරාකෑම්වලට, විකිණීමට ලක්වීම්වලට හා ජාවාරම් වලට නිරාවරණය වීමේ අනතුර වැඩිකරවන කරුණු කාරණාවලට මුහුණ දීමට නෛතික, අධ්‍යාපනික සහ සමාජීය නිර්දේශයන්, සේවාවන් සහ වැඩසටහන් ස්ථාපිත කළ යුතුය.

මූලධර්ම

## 12 වැඩකිරීමේ අයිතිය

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම් කිරීමට ලක්වීමෙන් තොරව විරැකියාවට එරෙහිව සාධාරණ සහ ප්‍රියමනාප තත්වයක් තුළ යෝග්‍ය ඵලදයී රැකියාවක් කිරීමට සෑම දෙනාටම අයිතිය ඇත.

රාජ්‍යයන් විසින්:

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෘත්තීය පුහුණුව, බඳවා ගැනීම, උසස්වීම්, සේවයෙන් පහකිරීම, සේවා නියුක්තියේ තත්වයන් සහ පාරිතෝෂික යන තත්වයන්ද ඇතුලුව රාජ්‍ය සහ පෞද්ගලික සේවානියුක්තියේ වෙනස්කම් කිරීමට ලක්වීම නැවැත්වීමට ද, අවසන් කිරීමටද අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා රාජ්‍ය සේවයේ සියලුම තත්වයන්, ප්‍රසිද්ධ උත්සවයන්ගේ රැකියාවන්, පොලීසියේ සහ මිලිටරියේ සේවය කිරීම් ඇතුලුව උසස්වීමේ ඉඩ ප්‍රස්ථාවන්ගේ සමානාත්මතාවය සහතික කරමින් ඕනෑම වෙනස්කම් කිරීමක් තුරන් කළ යුතුය, එමෙන්ම වෙනස් කම් කිරීමේ ආකල්පයන්ට එදිරිව ක්‍රියා කිරීමට යෝග්‍ය පුහුණුව සහ සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය;

මූලධර්ම

## 13 සමාජ ආරක්ෂණය සහ වෙනත් සමාජීය ආරක්‍ෂණයන් සඳහා ඇති අයිතිය

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය ම වෙනස්කම්වලට ලක් නොවී සමාජ ආරක්ෂණය සහ වෙනත් සමාජීය ආරක්‍ෂණයන් සඳහා සෑම දෙනෙකුටම අයිතිය ඇත.



රාජ්‍යයන් විසින්;

1. ලිංගික නැඹුරුතාව හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස් කම් වලට ලක් නොවී සාමානව රැකියා නියුක්තික ප්‍රතිලාභ, දෙමාපිය නිවාඩු, රැකියා වියුක්ති ප්‍රතිලාභ, සෞඛ්‍ය රක්ෂණ හෝ සැළකිල්ල හෝ ප්‍රතිලාභ හෝ (ලිංගික අන්‍යතාවට සම්බන්ධිතව ශරීරය වෙනස් කිරීමේ දේවල්ද ඇතුළත්ව) විවාහිකයා හෝ සහකරුවාගේ අසනීපවීමෙන් හෝ මරණයෙන් අහිමිවන සහයෝගයට අදාලව අනෙක් සමාජීය රක්ෂණ, පවුල් ප්‍රතිලාභ,

2. මරණ ප්‍රතිලාභ, විශ්‍රාම වැටුප් සහ ප්‍රතිලාභයන් ද ඇතුළුව සමාජ ආරක්ෂණය සහ වෙනත් සමාජීය ආරක්‍ෂණයන්ට ප්‍රවේශ වීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

3. දරුවන්ට සමාජ ආරක්ෂණ පද්ධතියේ හෝ සමාජීය හෝ සුභසාධන ප්‍රතිලාභ සැපයීමේ දී ඔවුන්ගේ පවුලේ සාමාජිකයෙකු හෝ ඔවුන්ගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම් කිරීමට ලක්නොවීම සහතික කළ යුතුය.

4. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම් කිරීමට ලක්වීමෙන් තොරව දිළිඳුකම දුරලීමේ උපාය මාර්ග සහ වැඩ සටහන්වලට ප්‍රවේශ වීමේ හැකියාව සහතික කිරීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

මූලධර්ම

## ප්‍රමාණවත් ජීවන තත්වයක් සඳහා ඇති අයිතිය 14

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම්වලට ලක් නොවී ප්‍රමාණවත් ආහාර, ආරක්ෂිත පානීය ජලය, ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහ ඇඳුම්, සහ ජීවන තත්වයේ අඛණ්ඩ වර්ධනය ඇතුලුව

රාජ්‍යයන් විසින්;

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම්වලට ලක් නොවී ප්‍රමාණවත් ආහාර, ආරක්ෂිත පානීය ජලය, ප්‍රමාණවත් සනීපාරක්ෂක පහසුකම් සහ ඇඳුම්වලට ප්‍රවේශ වීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

මූලධර්ම

## ප්‍රමාණවත් නිවාස සඳහා ඇති අයිතිය 15

නිවසින් පිටමං කිරීමෙන් වැළැක්වීමේ ආරක්ෂාව ද ඇතුළුව ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම්වලට ලක් නොවී ප්‍රමාණවත්නිවාස සඳහා සියලු දෙනාට අයිතිය ඇත.

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම්වලට ලක් නොවී නිවාස භුක්ති විඳීමේ සහ ආවරණිත සහ අනෙකුත් හදිසි පිළිසරණ ඇතුළුව වියදම දරාගතහැකි, වාසය කළ හැකි, ප්‍රවේශ විය හැකි, සංස්කෘතිකව සුදුසු නිවාස සෑම දෙනාටම සහතික වීමට අවශ්‍ය සියලුම අත්‍යාවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා හෝ වෛවාහික හෝ පවුල් තත්වයන් නිසා හෝ වෙනස්කම් කිරීමට ලක් නොවී අන්තර්ජාතික මානව අයිතීන්ගේ බැඳීම් සමඟ අනුකූළ නොවන්නා වූ

නිවාසවලින් පිටතට ඇද දැමීම් තහනම් කිරීමට සහ වඩාත් සුදුසු හෝ ගුණාත්මකව වඩා යහපත් විකල්ප බිමක නැවත පදිංචි වීමේ අයිතිය ඇතුළුව නිවාස වලින් පිටතට ඇද දැමීමට එරෙහිව ඕනෑම පුද්ගලයෙකුට තම අයිතිය ප්‍රකාශ කිරීමේ ප්‍රමාණවත් සහ ඵලදායී නෛතික හෝ අනෙක් සුදුසු ප්‍රතිකර්මයන් පවතින බවට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

3. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම්වලට ලක් නොවී භූමිය හෝ නිවාස හිමිකාරීත්වයට සහ ප්‍රවේණීය උරුමයන්ට හිමිකම් කීමේ සමාන අයිතිය සහතික කළ යුතුය;

4. සමාජීය පිටමං කිරීම, ගෘහස්ත හා අනෙක් ආකාරයන්ගේ අපරාධ, වෙනස්කම් කොට සැළකීම, මූල්‍යමය ස්වාධිනතාවය අහිමි වීම පවුලෙන් හෝ සංස්කෘතික ප්‍රජාවෙන් පිටමං කිරීම ඇතුළුව ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවයට සම්බන්ධිත කාරණා නිසා විශේෂයෙන්ම දරුවන් හා තරුණ අය නිවාස රහිත බවේ අනතුරට නිරාවරණය වීම වැඩිකරවන කාරණාවලට පිළිතුරු දීමට උපකාරක වැඩසටහන් හා සමාජීය වැඩසටහන් ස්ථාපිත කිරීම ද අසල්වාසී උපකාරක සහ ආරක්ෂක ව්‍යාපෘතීන්ට අනුබල දීමද කළ යුතුය;

5. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය හේතුවෙන් නිවාස අහිමිවීමට හෝ සමාජීය අනර්ථයන්ට මුහුණ දුන්නවුන්ගේ අවශ්‍යතාවයන් පිළිබඳව අදාල සියළුම කාර්යාශයන් සාවධාන වන බව සහතික කිරීම වෙනුවෙන් පුහුණුව සහ සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය;

මූලධර්ම

## 16 අධ්‍යාපනය ලැබීම සඳහා ඇති අයිතිය

ලිංගික නැඹුරුතාවය සහ සමාජ-ලිංගික අනන්‍යතාවය සැළකිල්ලට ගැනීමෙන් හෝ ඒ මත පදනම් වීමෙන් වෙනස්කම් කිරීමට ලක් නොවී අධ්‍යාපනය ලැබීමේ අයිතිය සෑම දෙනාටම ඇත.

රාජ්‍යයන් විසින්;

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස්කම්වලට ලක් නොවී අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ සමාන අයිතිය, අධ්‍යාපන පද්ධතිය තුළ සිටින සිසුන්ගේ, කාර්ය මණ්ඩලයේ සහ ගුරුවරුන්ගේ සමාන සැළකීම් ලැබීම සහතික වීමට අවශ්‍ය සියළුම අත්‍යාවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. අධ්‍යාපනය සියලුම ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ පෞරුෂය, කුසලතා සහ මානසික සහ ශාරීරික හැකියාවන් ඒවායේ සම්පූර්ණ ශක්‍යතාවයට වර්ධනය කිරීමටත්, සියලුම ලිංගික නැඹුරුතාවයන් හා අනන්‍යතාවයන්වල සිසුන්ගේ අවශ්‍යතාවයන්ට ප්‍රතිචාර දැක්වීමටත් යොමුවන බවට සහතික විය යුතුය;

3. අධ්‍යාපනය මානව අයිතීන්ට ගරුකිරීම වර්ධනය කිරීමට සහ සෑම දරුවෙකුගේම මව්පියන්ට සහ පවුලේ අයට, සංස්කෘතික අනන්‍යතාවයන්ට, භාෂාවන්ට සහ වටිනාකම්වලට ගරු කිරීමට, සාමය, ඉවසීම සහ සමානාත්මතාවයේ භාවාර්ථය හඳුනා ගැනීමට, සියලුම ලිංගික නැඹුරුතාවයන් වලට හා ලිංගික අනන්‍යතාවයන්ට ගරු කිරීමට හා අගය කිරීමට යොමුවන බවට සහතික විය යුතුය;

4. අධ්‍යාපන ක්‍රමවේද, විෂය මාලා සහ සම්පත් යන ඒවා සිසුන්ගේ, ඔවුනගේ දෙමව්පියන්ගේ සහ පවුලේ සාමාජිකයන්ගේ සුවිශේෂී අවශ්‍යතාද ඇතුලුව එකිනෙකා අතර වැටහීම වැඩි කිරීමට සහ වෙනත් කරුණු අතර විවිධ ලිංගික නැඹුරුතාවයන් වලට සහ ලිංගික අනන්‍යතාවයන්ට ගරු කිරීමට යෙදවෙන බවට සහතික විය යුතුය;

5. වෙනස් ලිංගික නැඹුරුතාවය සහ ලිංගික අනන්‍යතා සහිත සිසු සිසුවියන්ට, කාර්යය මණ්ඩල සාමාජිකයින්ට සහ ගුරුවරුන්ට පාසල් පරිසරය තුළ දමරික කම් සහ හිරිහැර කිරීම් ඇතුලුව සියලුම ආකාර-යේ සාමාජීය පිටමං කිරීමෙන් සහ අපරාධයන්ගෙන් ආරක්ෂා වීමට අවශ්‍ය ප්‍රමාණවත් නීති සහ පිළිවෙත් සපයා ඇති බවට සහතික විය යුතුය;

6. එවැනි ලෙස සමාජීය පිටමං කිරීමට හෝ අපරාධයන්ට මුහුණ පෑ සිසු සිසුවියන් ආරක්ෂාව සඳහා ඔවුන් කොන් කිරීමට හෝ වෙන් කිරීමට ලක් නොකළ බවට සහතිකවිය යුතුය, එසේම ඔවුන්ගේ ප්‍රශස්ථ අභිරුචීන් සුවිශේෂීව හඳුනාගැනීමට හා ගෞරවයට ලක් වන බවට සහතික විය යුතුය;

7. අධ්‍යාපන ආයතනයන්ගේ විනය සිසු සිසුවියන්ගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය හෝ එහි ප්‍රකාශනය හෝ පදනම් නොවී මිනිස් අභිමානයෙන් යුතුව පරිපාලනය වන බවට බවට අවශ්‍ය සියලුම අත්‍යාවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

8. දැනටමත් අධ්‍යාපන පද්ධතිය තුළ වෙනස්කම් කිරීමෙන් පීඩාවට ලක් වී ඇති වැඩිහිටියන්ද ඇතුලුව ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කම් කිරීම්වලට ලක් නොවී ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමට අවස්ථාවන් හා සම්පත් වලට ප්‍රවේශය තිබෙන බවට සහතික විය යුතුය;

මූලධර්ම

## ලබා ගතහැකි උසස්ම තත්වයේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ අයිතිය 17

සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස් කම් කිරීම්වලට ලක් නොවී ලබා ගතහැකි උසස්ම තත්වයේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ අයිතිය සෑම දෙනාටම අයිතියක් ඇත. ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යය මෙම අයිතියේ මූලිකම අංගයකි.

රාජ්‍යයන් විසින්:

1. සමාජ ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කම් කිරීම්වලට ලක් නොවී ලබා ගතහැකි උසස්ම තත්වයේ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමේ අයිතිය භුක්ති විඳීම සඳහා අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කම් කිරීම්වලට ලක් නොවී සියලුම පුද්ගලයින්ට ලිංගික හා ප්‍රජනන සෞඛ්‍යද ඇතුළුව ඔවුන්ගේම වෛද්‍ය වාර්තාවලට, සෞඛ්‍ය පහසුකම්, භාණ්ඩ හා සේවා වලට ප්‍රවේශ වීමේ පහසුව සඳහා අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

3. සෞඛ්‍ය පහසුකම්, භාණ්ඩ හා සේවා යනාදිය සියලුම පුද්ගලයින් සඳහා වෙනස් කම් කිරීම්වලට ලක් නොවී සෞඛ්‍ය තත්වය වැඩි දියුණු කිරීමට, අවශ්‍යතාවන්ට ප්‍රතිචාර දැක්වීමට, ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය ගණනයට ගැනීමට, ඒ වෛද්‍ය වාර්තාවල රහස්‍යභාවය සුරැකීමට සහතික විය යුතුය;

4. ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා පූර්ව විනිශ්චය, වෙනස්කම් කිරීම ඇතුලු අනෙක් සමාජීය කාරණා වලට ආමන්ත්‍රණය කිරීමට වැඩසටහන් නිර්මාණය කිරීම හා ක්‍රියාවට නැංවීම සිදු කළ යුතුය;

5. නියම වශයෙන් දැනුවත් අනුමැතිය මත වෛද්‍ය ප්‍රතිකාර හා වෛද්‍ය සැළකිලි ගැන තමන්ගේම තීරණ ගැනීමට ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කම් කිරීම්වලට ලක් නොවී සියලුම පුද්ගලයින් දැනුවත් කර බලාත්මක කර තිබෙන බවට සහතික විය යුතුය;

6. සියලුම ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය, අධ්‍යාපනය, නිවාරණය, සැලකිලි සහ ප්‍රතිකාර වැඩසටහන් සහ සේවාවන් ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කම් කිරීම්වලට ලක් නොවී සියල්ලන්ටම සමානව ලැබිය හැකි බවට සහතික විය යුතුය;

7. නැවත ලිංගය සැකසීමට සම්බන්ධ ශරීරය වෙනස් කිරීම් අවශ්‍යව සිටින්නවුන්ට වෙනස්කම්වලට ලක්නොවී වෛද්‍ය ප්‍රතිකාර, සැළකිල්ල සහ ආධාර ලැබීමට පහසුකම් සැළැස්විය යුතුය;

## මූලධර්ම 18 වෛද්‍ය අපයෝජනයෙන් ආරක්ෂාවීමේ අයිතිය

ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා කිසිදු පුද්ගලයෙකු වෛද්‍යමය හෝ මනෝ වෛද්‍යමය ප්‍රතිකාර, වෛද්‍ය ක්‍රියා පටිපාටි, පර්යේෂණ, හෝ වෛද්‍යායතනයක් තුළ සිරකිරීම හෝ නොකළ යුතුය. ඊට වෙනස් වර්ගීකරණ තත්වයක දී වුවත්, පුද්ගලයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව මැඩපැවැත්වීමට සුවකිරීමට හෝ එවැනි අහිතකර ක්‍රියාමාර්ග වලට ඔවුන් යොමු නොකිරීමටද ක්‍රියා කල යුතුය

රාජ්‍යයන් විසින්:

1. ඒකාකෘතීන් මත පදනම් වී, සංස්කෘතියෙන් හෝ වෙනත් ආකාරවලින්, පැවැත්මට අදාලව, ශාරීරික ලක්ෂණ හෝ අපේක්ෂිත ලිංගික ප්‍රතිමානයන්ගෙන් භින්න වීමෙන්, ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව හේතුවෙන් හානිකර වෛද්‍යමය ක්‍රියාමාර්ග ගැනීම වැළැක්වීමට අවශ්‍යවන සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. වයස සහ පරිනත බවට අදාලව සහ දරුවන්ට අදාල ක්‍රියාමාර්ගවල මූලධර්මයන්ට අදාලව දරුවාගේ සම්පූර්ණ, ස්වාධීන, දැනුවත් අනුමැතිය නොමැතිව කිසිම දරුවෙකුගේ ශරීරයකට වෛද්‍යමය ක්‍රියාමාර්ගයක් මගින් ලිංගික අනන්‍යතාවයක් එබ්බවීම වැලැක්වීම සඳහා අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය; දරුවාගේ අයිතිවාසිකම් හා සුභ සිද්ධිය මූලිකම කාරණා වෙයි.

3. කිසිම දරුවකු වෛද්‍ය අපයෝජනයට ලක් නොවන බවට හෝ ඒ අනතුරට මුහුණ නොදෙන බවට ළමා ආරක්ෂක යාන්ත්‍රනයක් ස්ථාපිත කල යුතුය

4. ප්‍රතිශක්තීකරණය, එච්.අයි.වී./ඒඩ්ස් හෝ වෙනත් ප්‍රතිකාර සඳහා ක්ෂුද්‍රජීවී ප්‍රතිකාර ද ඇතුලුව විවිධ ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවන් සහිත පුද්ගලයින්ගේ ආචාර ධර්මීය නොවන හෝ අකමැත්තෙන් සිදු කරන වෛද්‍ය ක්‍රියාපටිපාටීන් හෝ පර්යේෂණයන්ගෙන් පුද්ගලයින් ආරක්ෂාකර ගැනීම සහතික කල යුතුය.

5. එවැනි අපයෝජනවලට අනුග්‍රහය දෙන හෝ ඉඩ සළස්වන හෝ වෙනත් ආකාරයකින් එම තත්වය ඇතිකරවන සංවර්ධන උපකාර ස්වරූපයේ වන ඕනෑම සෞඛ්‍ය ආධාර සැපයීම් හෝ වැඩසටහන් විමර්ශණය හා සංශෝධනය කිරීම කළ යුතුය.

6. වෛද්‍යමය හෝ මනෝ වෛද්‍යමය ප්‍රතිකාරයන් හෝ උපදේශන සේවාවන් විවෘතව හෝ ව්‍යංගව ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවට වෛද්‍යමය තත්වයක් ලෙස සළකා ප්‍රතිකාර කිරීම, සුව කිරීම හෝ මැඩ පැවැත්වීම සිදු නොකරන බවට සහතික විය යුතුය.



## මූලධර්ම 19 මතයක් දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහස

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය කුමක් වුවත් සියලු දෙනාටම මතයක් දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහස ඇත. එම නිදහසට කතාබහ, හැසිරීම, ඇඳුම් පැළඳුම්, ශාරීරික අංග ලක්ෂණ වලින් අනන්‍යතාවයේ ප්‍රකාශ කිරීම හෝ පුද්ගලභාවය අඩංගු වේ, එසේම සීමාවකින් තොරව ඕනෑම මාධ්‍යක් මගින් මානව අයිතීන්ට, ලිංගික නැඹුරුතාවය සහ ලිංගික අනන්‍යතාවට අදාල සියලුම වර්ගයේ තොරතුරු සහ අදහස් ගවේෂණයේ, ලබා ලැනීමේ හා බෙදා ගැනීමේ අයිතිය ද ඇත.

රාජ්‍යයන් විසින්:

1. ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවට අදාලව තොරතුරු ලබා ගැනීම හා බෙදා ගැනීමද එමෙන්ම නෛතික අයිතීන්, ප්‍රකාශන, රූපවාහිනී හෝ ගුවන් විදුලි විකාශන. සම්මන්ත්‍රණ සංවිධානය කිරීම හෝ සහභාගිවීම, ආරක්ෂිත ලිංගිකත්වය පිළිබඳ තොරතුරු ලබා ගැනීම හෝ බෙදාහැරීම වෙනුවෙන් පෙනී සිටීමද ඇතුලුව, ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා වෙනස්කම් කිරීමට ලක් නොකර අනිත් අයගේ අයිතීන්ට හා ස්වාධීනත්වයට ගරු කරන අතරතුර මතයක් දැරීමේ සහ ප්‍රකාශනයේ නිදහස උපරිම ලෙස බුක්ති විඳීම සහතික කිරීම වෙනුවෙන් අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. මාධ්‍යයන්ගේ නිෂ්පාදන සහ ආයතනික සංවිධානයන් බහුත්වවාදී සහ ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවට අදාලව වෙනස්කම් නොකෙරෙන බවට සහතික විය යුතුය, එසේම ඒවායේ සේවක බඳවා ගැනීම් සහ උසස්වීම් ප්‍රතිපත්තීන් ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවට අදාලව වෙනස්කම් නොකෙරෙන බවට සහතික විය යුතුය කතාබහ, හැසිරීම, ඇඳුම් පැළඳුම්, ශාරීරික අංග ලක්ෂණ වලින්, නමක් තෝරා ගැනීමෙන් හෝ වෙනත් ආකාරයකින් අනන්‍යතාව හෝ පුද්ගලභාවය ප්‍රකාශ කිරීමේ අයිතිය සම්පූර්ණයෙන් බුක්ති විඳීම සඳහා සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය

3. මහජන සැළසුමේ, මහජන සදාචාරයේ, මහජන සෞඛ්‍යයේ සහ මහජන ආරක්ෂාවේ සංකල්පනයන් ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවයේ මතයක් දැරීමේ හෝ ප්‍රකාශනය සීමා කරමින් වෙනස්කම් කිරීමේ ස්වරූපයෙන් යෙදවී නොමැති බවට සහතික විය යුතුය;

4. මතයක් දැරීමේ හා ප්‍රකාශනයේ අයිතිය විසින් වෙනස් ලිංගික නැඹුරුතාවය හා ලිංගික අනන්‍යතාවයේ පුද්ගලයින්ගේ අයිතීන් සහ ස්වාධීනත්වයන් උල්ලංඝනය නොකරන බවට සහතික විය යුතුය;

5. ලිංගික නැඹුරුතාවය හා ලිංගික අනන්‍යතාව නොසලකා සියලුම පුද්ගලයින්ට සමානව තොරතුරු හා අදහස් වෙත ප්‍රවේශ වීමටත්, ප්‍රසිද්ධ විවාදයන්ට සහභාගී වීමටත් ඇති අයිතිය පිළිබඳ සහතික වන්න.

## මූලධර්ම 20 සාමකාමීව රැස්වීමට හා සංවිධානය වීමට ඇති අයිතිය

සාමකාමී පෙළපාලි අරමුණු ද ඇතුලුව ලිංගික නැඹුරුතාවය හා ලිංගික අනන්‍යතාව නොසලකා සියලුම ආකාර ලෙස සාමකාමීව රැස්වීමට හා සංවිධානය වීමට අයිතිය ඇත. ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම් සංවිධාන සහ ඔවුනට හෝ ඔවුන් ගැන තොරතුරු බෙදා හරින සංවිධාන, ඔවුන් අතර සන්නිවේදනය සහසු කරන හෝ විවිධ ලිංගික නැඹුරුතාවය සහ ලිංගික අනන්‍යතාවන් හි පුද්ගලයින්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටින සංවිධාන පිහිටුවා ගැනීමට හැකිය.

රාජ්‍යයන් විසින්

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය මත පදනම්ව වෙනස්කම් කිරීමට ලක් නොවී සාමකාමීව සංවිධානය වීමට, එකතු වීමට, රැස්වීමට සහ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය වෙනුවෙන් පෙනී සිටීමට, සහ මෙවැනි සංවිධාන හෝ කණ්ඩායම් වෙතට නෛතික පිළිගැනීම ලබා ගැනීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. මහජන සැළසුමේ, මහජන සදාචාරයේ, මහජන සෞඛ්‍යයේ සහ මහජන ආරක්ෂාවේ සංකල්පනයන් මගින් වෙනස් ලිංගික නැඹුරුතාවයන් හෝ සමාජ-සමාජ-ලිංගික අනන්‍යතාවයන් නිසා සාමකාමීව රැස්වීමට හා සංවිධානය වීමට අයිතිය බුක්ති විඳීම සීමා නොකරන බවට සහතික විය යුතුය.

3. කිසිම තත්වයක දී ලිංගික නැඹුරුතාවයන් හෝ සමාජ-සමාජ-ලිංගික අනන්‍යතාවයන් නිසා සාමකාමීව රැස්වීමට හා සංවිධානය වීමට අයිතිය බුක්ති විඳීම වැලැක්වීම සිදු නොවීම, සහ මේ අයිතීන් ක්‍රියාවට නැංවීමේ පුද්ගලයින්ට ප්‍රමාණවත් පොලිස් සහ අපරාධ හෝ හිරිහැර කිරීම් වලට එරෙහිව අනෙක් ශාරීරික ආරක්ෂාවක් සහතික කල යුතුය

4. මෙවන් ආරක්ෂාවක් සැපයීමට හැකියාව ලැබෙන පරිදි නීති බලාත්මක බලධාරීන්ට සහ අනිත් නිළධාරීන්ට සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය;

5. ලිංගික අනන්‍යතාව හා ලිංගික නැඹුරුතාවය අමතන කන්ඩායම් හා ස්වේඡචා සංවිධාන හා ඔවුන්ගේ සාමාජිකයන් සඳහා තොරතුරු හෙලිදරව් කිරීමේ නීතිය භාවිතා වීම නිසා, ඔවුන් වෙනස්කම් කිරීමේ ප්‍රතිඵලයන්ට ලක්වීමට ඉඩ නොතැබිය යුතුය:

## මූලධර්ම 21 සිතීමට, හෘද සාක්ෂියට හා ආගමට ඇති අයිතිය.

ලිංගික අනන්‍යතාව හා ලිංගික නැඹුරුතාවය කුමක් වුවත් සිතීමේ අයිතිය, හෘද සාක්ෂියට එකඟව ජීවත්වීම මෙන්ම ආගමික විශ්වාසයන් දැරීමේ අයිතියද සැමදෙනා සතුවේ. ලිංගික අනන්‍යතාව හා ලිංගික සැකැස්ම මත පදනම් වූ වෙනස්කම් කිරීම, නීතිය ඉදිරියේ සමානාත්මතාවය වලක්වන නීතීන්, ප්‍රතිපත්තීන් හෝ භාවිතයන් සාධාරණීකරණය කිරීමට රාජ්‍යයන් විසින් භාවිතා නොකළ යුතුය.

රාජ්‍යයන් විසින්

1. ලිංගික අනන්‍යතාව හෝ ලිංගික නැඹුරුතාවය කුමක් වුවත්, තනිව හෝ අනිකුත් අය සමඟ සහයෝගීව විශ්වාසයන්ට මැදිහත්වීමකින් තොරව, බලහත්කාරීව හෝ විශ්වාසයන් බලයෙන් පැනවීමකින් තොරව ආගමික හෝ ආගමික නොවන විශ්වාසයන් තබා ගැනීමට හෝ භාවිතයේ යෙදීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. වෙනස් මතවාද ප්‍රකාශනය, භාවිතය සහ ප්‍රවර්ධනය, දණ්ඩ විනිශ්චය සහ විශ්වාස ලිංගික අනන්‍යතාව හෝ ලිංගික නැඹුරුතාවය මානව අයිතීන් සමඟ පරස්පර විරෝධීව පවරා නොගන්නා බවට සහතික විය යුතුය

## මූලධර්ම 22 නිදහසේ සංචාරය කිරීමේ අයිතිය

ලිංගික අනන්‍යතාවට හෝ ලිංගික නැඹුරුතාවය හෝ අදාල වද හිංසා කිරීම ද ඇතුලුව වෙනත් රටකින් වද හිංසාවලට ආරක්ෂාව ඉල්ලීමට සහ ආරක්ෂාව ලැබීමට සැම දෙනාටම අයිතියක් ඇත. ලිංගික අනන්‍යතාව හෝ ලිංගික සැකැස්ම නිසා වද දීම්වලට, හිංසාවට හෝ වෙනත් ආකාරයක කෲරත්වයක්, අමානුෂිකත්වයක් හෝ ආත්ම ගෞරවය කෙළෙසන සැලකීමක් හෝ දඬුවමක් ලැබීමේ බිය ඇති රටකට නෙරපීම, පිටුවහල් කිරීම රාජ්‍යයක් විසින් නොකළ යුතුය.

රාජ්‍යයන් විසින්

1. පුද්ගලයෙකුගේ ලිංගික අනන්‍යතාව හෝ ලිංගික නැඹුරුතාවය නිදහසේ සංචාරය කිරීමට සහ වාසය කිරීමට බාධාවක් නොවීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

## මූලධර්ම 23 වෙනත් රටක ආරක්ෂාව පැතීමේ අයිතිය

පුද්ගලයෙකුගේ ලිංගික අනන්‍යතාව හෝ අවධාරණය හේතුකොට ගෙන සිදු කරනු ලබන වධ බන්ධන වලින් මිදී වෙනත් රටක ආරක්‍ෂාව පැතීම සහ එය භුක්ති විඳීමේ අයිතිය සෑම පුද්ගලයෙකුම සතුවේ. එසේම උක්ත කරුණ සම්බන්ධව තම රටේදී වධ බන්ධන වලට ලක්වීමට පහරදීම් වලට සහ ආත්ම ගෞරවය කෙලසන ක්‍රියාවන් වලට ලක්වීමට පැහැදිලිවම ඉඩ ඇති පුද්ගලයන්ව නැවතත් එම රටටම පිටුවහල් කිරීමක් හෝ නෙරපා හැරීමක් රජය විසින් සිදුනොකල යුතුය.

රාජ්‍යයන් විසින්

1. ලිංගික නැඹුරුතාවය හා ලිංගික අනන්‍යතාව හේතු කොට ගෙන පැහැදිලි සාක්ෂි සහිතව වධ බන්ධන වලට ලක්වීමේ භීතියෙන් පෙලෙන පුද්ගලයන් සඳහා සරණාගතයින් ලෙස හෝ වෙනත් රටක ආරක්‍ෂාව පතන පුද්ගලයන් සඳහා නම්‍යශීලී පිලිවෙතක් අනුගමනය කිරීමට සහ ඔවුන් පිලිගැනීමට අවශ්‍යකරන නීතිරෙගුලාසි පැනවීම හෝ තිබෙන නීති සංශෝධනය හෝ කලයුතු වේ.

2. ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව මත පදනම් සහිත හිංසා කිරීම ආරක්ෂාව ලැබීමේ තත්වයක් ලෙස හඳුනා ගන්නා පරිදි ව්‍යවස්ථාදායකය විමර්ශනය කිරීම, සංශෝධනය කිරීම නීතිගත කිරීම කළ යුතුය

3. ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා ආරක්ෂාව සොයන්නන්ට එරෙහිව වෙනස්කම් කිරීමේ භාවිතයක් හෝ ප්‍රතිපත්තියක් නොමැති බවට සහතික විය යුතුය

4. ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව නිසා වධ බන්ධන වලට ලක්වීමට පහරදීම් වලට සහ ආත්ම ගෞරවය කෙලසන ක්‍රියාවන් වලට ලක්වීමට පැහැදිලිවම ඉඩ ඇති රටකට පුද්ගලයන්ව නැවත පිටුවහල් කිරීමක් හෝ නෙරපා හැරීමක් රජය විසින් සිදුනොකරන බවට සහතික විය යුතුය

## මූලධර්ම 24 පවුලක් ගොඩනගා ගැනීමේ අයිතිය

ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව කුමක් වුවත් සෑම දෙනාටම පවුලක් ගොඩ නගා ගැනීමේ අයිතිය ඇත. විවිධ ආකාරයේ පවුල් ඇත. ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව මත කිසිම පවුලක් හෝ පවුලක සාමාජිකයෙකු වෙනස්කම් කිරීමට ලක් නොවිය යුතුය.

රාජ්‍යයන් විසින්:

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස් කම් කිරීමට ලක් නොවී දරුවකු හදාවඩා ගැනීම, සහයෝගී ප්‍රජනනය (කෘතිම සිංචනය) ද ඇතුළත්ව පවුලක් සාදා ගැනීමේ සෑම දෙනෙකුටම ඇති අයිතිය සඳහා අවශ්‍ය  සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. වංශ පෙළපතින් හෝ පවුලෙන් අර්ථ නොගැන්වූ වෙනස් වූ පවුල් අකෘතීන්ගේ විවිධත්වය හඳුනා ගැනීමට නීති හා ප්‍රතිපත්ති ස්ථාපිත කරන්න, පවුල් සම්බන්ධ සමාජීය සුභසාධනය සහ අනෙක් මහජන සහයෝගීතා, රැකියා නියුක්තිය සහ සංක්‍රමණ අයිතීන්ට අදාලව කිසිම පවුලක් ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය නිසා වෙනස් කම් කිරීමට අවශ්‍ය  සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

3. දරුවන්ට අදාල ක්‍රියා සහ තීරණ පුද්ගලික හෝ රාජ්‍ය සමාජීය සුභසාධක ආයතන, නීතියේ අධිකරණ, පරිපාලන බලධාරීන් හෝ ව්‍යවස්ථාදායක ආයතන වල මූලික සළකා බැලීම විය යුත්තේ දරුවාගේ සුබ සිද්ධියයි, එසේම දරුවාගේ හෝ පවුලේ කිසිම පුද්ගලයෙකුගේ හෝ සාමාජිකයෙකුගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවය එවැනි සුබ සිද්ධියට අදාලව පරස්පර විරෝධී යැයි නොසැළකීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

4. දරුවන්ට අදාල ක්‍රියාකාරීත්වයන් සහ තීරණ වලදී පුද්ගලික දැක්මක් සකසාගත හැකි නිදහසේ ඒවා ප්‍රකාශ කළ හැකි දරුවෙකුට දරුවාගේ වයස සහ පරිනතභාවය අනුව එම දැක්මවල් වලට සෑහෙන බරක් තැබිය යුතුය.

5. සම ලිංගික විවාහය හෝ ලියාපදිංචි සහකාරකම පිළිගන්නා රාජ්‍යයන් හි විෂම ලිංගික පවුල්වලට ලැබෙන අයිතීන්, වරප්‍රසාද, බැඳීම් හෝ ප්‍රතිලාභ සම ලිංගික හෝ ලියා පදිංචි සහකරුවන්ට ද සමානව ලැබෙන බවට අවශ්‍ය සියළුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

6. විවාහක පවුල්වලට ලැබෙන අයිතීන්, වරප්‍රසාද, බැඳීම් හෝ ප්‍රතිලාභ සමානව අවිවාහක සමලිංගිකයින්ට ද ලැබෙන බවට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

7. විවාහ හා අනෙක් නෛතිකව හඳුනාගත් සහකාරීත්වයන් අදාල වන්නේ අනෙක් සහකරුගේ හෝ පෙම්වතා පෙම්වතියගේ සම්පූර්ණ නිදහස් එකඟතාවය මතයි.

## මූලධර්ම 25 පොදු කටයුතු වලට සහභාගීවීමේ අයිතිය

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කිරීමට ලක්නොවී ප්‍රතිපත්තීන් නිර්මාණය කිරීම, මහජන සේවාවන්ගේ සියළුම තලයන්ට ප්‍රවේශ වීම, පොලීසිය මිලිටරිය ඇතුළු සමාජීය සේවාවන්ගේ සේවය කිරීමේ අයිතිය ඇතුළු මහජන සම්බන්ධතා ක්‍රියාවලීන් සමඟ සම්බන්ධවීමට සෑම පුරවැසියෙකුටම අයිතියක් ඇත.

රාජ්‍යයන් විසින්:

1. මිලිටරියේ, පොලීසියේ සේවය කිරීම ඇතුලුව, ඡන්දය ඉල්ලීමට ඇති අයිතිය ඔවුනට බලපාන ප්‍රතිපත්තීන් නිර්මාණය කිරීමට සම්බන්ධ වීම, සියලුම මට්ටමේ මහජන සේවාවන්ට සහ රැකියාවන්ට සමාන ප්‍රවේශ අයිතිය ඇතුලුව පොදු කටයුතුවලට සහභාගී වීමේ අයිතිය ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කිරීමට ලක්නොවී ඒවාට කරන සම්පූර්ණ සැළකීමකින් යුතුව සිදු කිරීමට නීති විශ්ලෙෂණය නීතිරෙගුලාසි පැනවීම හෝ තිබෙන නීති සංශෝධනය හෝ කළ යුතු වේ.

2. මහජන ජීවිතයට සහභාගීවීම වලක්වන හෝ සීමා කරන ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව අදාල ඒකාකාරීත්වය හා පූර්ව විනිශ්චය තුරල් කිරීමට අවශ්‍ය අදාල සියලුම ක්‍රියා මාර්ග ගත යුතුය

3. ඔවුන්ගේ සුභ සාධනයට බලපාන ප්‍රතිපත්තීන් සැකසීමේදී ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව නිසා වෙනස් කිරීමට ලක්නොවී කරන්නාවූ සම්පූර්ණ සැළකීමකින් යුතුව සහභාගී වීමට අදාල අයිතිය සෑම අයෙකුටම සුරක්ෂිත කළ යුතුය

## මූලධර්ම 26 සංස්කෘතික ජීවිතයට සහාගීවීමේ අයිතිය

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව කුමක් වූවද සෑම දෙනාටම සංස්කෘතික ජීවිතයට නිදහසේ සහභාගීවීමටත්, සංස්කෘතික සහභාගිත්වය තුළින් විවිධ ලිංගික හැඩගැසීම හෝ සමාජ-ලිංගික අනන්‍යතාවන් ප්‍රකාශමාන කිරීමටත් සෑම දෙනාටම අයිතියක් ඇත.

රජයන් විසින්

1. ලිංගික නැඹුරුතාවයන් හෝ ලිංගික අනන්‍යතාවන් නොසලකා ඒවාට පූර්ණ සැළකීමෙන් යුතුව සියලුම පුද්ගලයින්ට සංස්කෘතික ජීවිතයට සහභාගි වීම සඳහා අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. සමාජ-ලිංගික අනන්‍යතාවය හා ලිංගික නැඹුරුතාවය අදාලව වෙනස් දෘෂ්ඨීන් ඇති කණ්ඩායම්  ඇතුලුව මේ මූළධර්මවලට අදාල මානව අයිතීන් සමඟ ස්ථිරතායීව රාජ්‍ය තුළ විවිධ සංස්කෘතික කණ්ඩායම්වල නියෝජිතයින් ගේ අන්‍යෝන්‍ය ගෞරවය සහ අන්තර් සංවාදයට පිළිගැනීම ලබා දිය යුතුය

## මූලධර්ම 27 මානව අයිතිවාසිකම්වලට අනුබල දීමේ අයිතිය

සමාජ-ලිංගික අනන්‍යතාවය හා ලිංගික නැඹුරුතාවය නිසා වෙනස්කම්වලට ලක් නොවී ස්වාධීනව හෝ අන් අය සමඟ සංවිධානය වී සෑම දෙනාටම ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ මානව අයිතීන්ට අනුබල දීමට, ආරක්ෂා කිරීමට සහ ඒවා යථාවක් බවට පත්කර ගැනීමට අයිතිය ඇත. මෙහි දී වෙනස් ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයින්ගේ අයිතීන්ට අනුබල දීමට සහ ආරක්ෂා කිරීමට එල්ල කරගත් ක්‍රියාකාරීත්වයන් ද ඇතුලත් වේ, එමෙන්ම නව මානව හිමිකම් ආකෘතීන් සහ ඒවා පිළිගැනීමට සාකච්ඡා කිරීම සහ සංවර්ධනය කිරීමද එයට ඇතුළත් වේ

රජයන් විසින්:

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව අදාල අයිතීන්ද ඇතුළත්ව මානව අයිතීන් ප්‍රවර්ධනය, ආරක්ෂා කිරීම සහ යථාවක් බවට පත්කිරීම දෙසට අනුකූල වූ පරිසරයක් සහතික කිරීමට අවශ්‍ය සියලුම අත්‍යවශ්‍ය ව්‍යවස්ථාදයක, පරිපාලනමය සහ අනෙකුත් නිර්දේශයන් ස්ථාපිත කළ යුතුය;

2. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව අදාල කාරණා සමඟ වැඩකරන මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ව සේම වෙනස් ලිංගික අනන්‍යතාවන් හා ලිංගික නැඹුරුතාවය සහිත මානව හිමිකම් ආරක්ෂකයින්ව එල්ල කරගත් ක්‍රියාවන් හෝ ව්‍යාපාරයන් සමඟ සටන් කිරීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගත යුතුය;

3. ඔවුන්ගේ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව කුමක් වුවද, ඔවුන් පෙනී සිටින මානව හිමිකම් කාරණා කුමක් වුවද සහභාගීවීමට, ජාතික හා අන්තර්ජාතික මානව හිමිකම් සංවිධාන සහ ආයතන සමඟ සන්නිවේදනය කිරීමට ඇති වෙනස්කම්වලට ලක් නොවී ප්‍රවේශ වීම බුක්ති විඳීමට ඇති අයිතිය සහතික කල යුතුය;

4. ඔවුන්ගේ මානව හිමිකම් සම්බන්ධ ක්‍රියා මාර්ග නිසා ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව සම්බන්ධ කාරණා සමඟ වැඩ කරන මානව හිමිකම් ආරක්ෂා කරන්නන්ට එරෙහිව රාජ්‍ය හෝ රාජ්‍ය නොවන අයගෙන් අපරාධ, තර්ජන, පලිගැනීම්, තත්වාකාර හෝ යුක්ති යුක්ත හෝ වෙනත් ඕනෑම ආකාරයක ක්‍රියාවකින් ආරක්ෂාව සහතික කල යුතුය;

5. විවිධ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව සහිත පුද්ගලයින්ගේ අයිතීන් ජාතිකව හෝ අන්තර්ජාතිකව ප්‍රවර්ධනය කිරීම හෝ ආරක්ෂා කිරීම සිදුකරන ආයතන වලට හඳුනා ගැනීමේ සහ පිළිගැනීමේ පහසුව සැළසිය යුතුය;

## මූලධර්ම 28 ඵලදායී ප්‍රතිකර්ම සහ පිළියම් ලබා ගැනීමේ අයිතිය

ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව නිසා අපරාධයන්ට ගොදුරු වූවන්ද ඇතුලුව මානව හිමිකම් උල්ලංඝනයට ගොදුරු වූ සෑම අයෙකුටම ඵලදායී ප්‍රතිකර්ම සහ පිළියම් ලබා ගැනීමේ අයිතිය ඇත. වන්දි ලබාදීමේ හා ප්‍රමාණවත් පූර්ව දීමනාවන් ලබාදීමේ කාරණය සඳහා වෙනස් ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව සහිත පුද්ගලයින් ද ඵලදායී ප්‍රතිකර්ම සහ පිළියම් ලබා ගැනීමේ අයිතියට අන්තර්ගත ය.

රාජ්‍යයන් විසින්:

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව නිසා මානව හිමිකම් උල්ලංඝනයට ගොදුරුවූවන්ද ඇතුලුව සුදුසු ලෙස වන්දි ලබාදීම, හානි පූරණය, පුනරුත්තාපනය, සන්තර්පනය, පුනරාවර්තනය නොවන බවට සහතික වීම සහ හෝ වෙනත් ඕනෑම ආකාරයේ විධියක් සහතික කිරීම වෙනුවෙන් ව්‍යවස්ථාව හා ප්‍රතිපත්තීන් විශ්ලේෂණය කිරීම ඇතුලුව අත්‍යවශ්‍ය ක්‍රියා පටිපාටීන් ස්ථාපිත කළ යුතුය;

2. එම පිළියම් බලගන්වා ක්‍රියාවට නැංවීම කාලානුරූපීව සිදුවන බවට සහතික විය යුතුය :

3. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව නිසා වූ මානව අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ කාරණා පිළිබඳ සියලුම පුද්ගලයින් පුහුණු කර ඇති බවට සහ ප්‍රතිකර්ම සහ පිළියම් ලබාදීමට ක්‍රියාකාරී ආයතන, හා සම්මුතීන් පිහිටුවා ඇතිබවට සහතිකවිය යුතුය ;

4. ප්‍රතිකර්ම සහ පිළියම් සොයන සියලුම පුද්ගලයින්ට ක්‍රියාවලීන් ගැන සියලුම තොරතුරු ලබා දී ඇති බවට සහතික විය යුතුය ;

5. ප්‍රතිකර්ම සහ පිළියම් ලබා ගැනීමට මිල දරා ගත නොහැකි වන අයට මූල්‍ය ආධාර සැපයෙන බවටත්, එවනි දේ ලබා ගැනීමට ඇති මූල්‍යමය හෝ වෙනත් බාධක ඉවත් කර ඇති බවටත් සහතික විය යුතුය ;

6. සියලුම මට්ටමේ මහජන අධ්‍යාපනයේ සිසුන් හා ගුරුවරුන් සහ අනෙක් වෘත්තීය ආයතනයන් හි අය ද ඇතුලුව මානව අයිතීන් උල්ලංඝනය කිරීමේ නැඹුරුව ඇති අය සඳහා ගෞරව කිරීම ගැනද, මෙම මූලධර්මයන්ට අනුව අන්තර්ජාතික මානව අයිතිවාසිකම් සම්මුතීන් ගැන ද එසේම ලිංගික අනන්‍යතාව හෝ ලිංගික නැඹුරුතාවය නිසා වෙනස්කම් කිරීමේ ආකල්පයන්ට එදිරිව යෝග්‍ය පුහුණුව සහ සුපරීක්ෂාකාරී දැනුවත් බව ඉහළ නැංවීමට දැනුවත් කිරීමේ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කළ යුතුය;

## මූලධර්ම 29 වගකීම් සහගත බව

ඕනෑම කෙනෙකුගේ මානව හිමිකමක් මෙහි සඳහන් වූ මූලධර්මයන්ද ඇතුලත්ව කඩකරනු ලැබුවේ නම් ඔහු හෝ ඇය ඍජුව හෝ වක්‍රව මානව හිමිකම් කඩ කිරීමකට වගකිවයුතු පුද්ගලයෙකි. එහිදී ඔවුන් රජයේ සහ රජයේ නොවන නිලධාරීන් වුවද වෙනසකින් තොරව ඔවුන්ගේ ක්‍රියාකලාපයට සමානුපාතිකව ඊට වගකිව යුතු පුද්ගලයන් වේ. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව අයත් පුද්ගලයන්ගේ මානව හිමිකම් කඩ කරන අපරාධකරුවන්ගෙන් ඊට සුදුසු දඬුවම් හෝ දුර්විපාකයන් නොලබන පුදුගලයෙකු හෝ නිලධාරියෙකු නැත.

ඔවුන් රාජ්‍ය නිළධාරීන් වූවත් නොවූවත් මේ මූලධර්මයන් ආමන්ත්‍රණය කරන මානව අයිතීන් උල්ලංඝනය කරන්නවුන් ඍජුව හෝ වක්‍රව එම උල්ලංඝනයන්ට බරපතලව හා ඒ හා සමානුපාතව වගකිව යුතුය. ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාව සම්බන්ධ මානව අයිතීන් උල්ලංඝනයකදී වැරදිකරුවන් දුර්විපාක නොලබා සිටිය යුතු නැත.

රාජ්‍යයන් විසින්

1. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව සම්බන්ධ මානව අයිතීන් උල්ලංඝනයකදී වැරදිකරුවන්ගේ වගකීම් සහගත බව සහතික කිරීම සඳහා සුදුසු අපරාධ, සිවිල්, පරිපාලනමය සහ අනෙක් ක්‍රියා පටිපාටීන් මෙන්ම නිරීක්ෂණ යාන්ත්‍රනයන් ස්ථාපිත කළ යුතුය;

2. මෙම මූලධර්මයන්හි විස්තර කර ඇති ආකාරයේ අපරාධයන්ද ඇතුලුව සත්‍ය හෝ පෙනෙන්නා වූ ආකාරයට ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව පදනම් කරගෙන සිදු කරන අපරාධයක් විගස මුළුමනින්ම විමර්ශනයට ලක් කර සුදුසු සාක්ෂි ලැබුනේනම් වගකිව යුත්තන්ට අභිචෝදනා කර නඩු අසා නියම ආකාරයට දඬුවම් කළ යුතුය;

3. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව පදනම් කරගෙන වෙනස්කම් කිරීම වැළැක්වීම සහතික කිරීම සඳහා නීති සහ ප්‍රතිපත්තීන් බලාත්මක කිරීමත්, ස්වාධීන ආයතන සහ ක්‍රියා පටිපාටීන් ස්ථාපිත කිරීමත් කළ යුතුය.

4. ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව පදනම් වූ මානව අයිතිවාසිකම් උල්ලංඝනයකට වගකිවයුතු වූ පුද්ගලයෙකු වගකීමෙන් වළක්වන ඕනෑම සාධකයක් ඉවත් කළ යුතුය;

## අතිරේක නිර්දේශයන්

මානව හිමිකම් යථාර්තවත් කිරීමට සමාජයේ සියලුදෙනාටත් ජාත්‍යන්තර ප්‍රජාවටත් වගකීම් ඇත. එනිසා අප විසින් පහත සඳහන් නිර්දේශයන් කරන්නෙමු:

A. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමසාරිස්වරයා විසින් මෙම මූළ ධර්මයන් අනුමත කර, බිම් මට්ටමෙන් සහ ලෝක මට්ටමෙන් ඒවා ක්‍රියාවට නැංවීමට අනුබල දෙමින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කාර්යාල කාර්යයන්ට ඔවුන්ව සමෝධානය කර ගැනීම කළ යුතුය;

B. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් මෙම මූළ ධර්මයන් අනුමත කර ඒවායේ හි රාජ්‍ය අනුකූලතාවයට අනුබල දීමේ අදහස ද ඇතිව ලිංගික නැඹුරුතාවය හෝ ලිංගික අනන්‍යතාවය මත පදනම් වන මානව හිමිකම් උල්ලංඝනයන්ට ප්‍රමාණවත් තරම් සැළකිල්ලක් ලබාදිය යුතුය;

C. එක්සත් ජාතීන්ගේ විශේෂ මානව අයිතීන් ක්‍රියා පටිපාටි විසින් ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව මත පදනම් වන මානව හිමිකම් උල්ලංඝනයන්ට නිසි අවධානය ලබා දිය යුතු අතර ඔවුන්ගේ විෂය වූ විධි නියෝගයන් ක්‍රියාත්මක කිරීමේ දී මෙම මුළධර්ම සමෝධානය කරගත යුතුය;

D. එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජීය කවුන්සිලය විසින් එහි 1996/31 ආඥාව අනුව විවිධ වූ ලිංගික නැඹුරුතාවය සහ සමාජ-ලිංගික අනන්‍යතාව සහිත පුද්ගලයින්ගේ මානව අයිතීන්ට අනුබල දීම සහ ආරක්ෂා කිරීම අරමුණු කරගත් රාජ්‍ය නොවන සංවිධානයන් හඳුනා ගැනීමත් සහ ඒවාට බලය පවරාදීමත් කළ යුතුය;

E. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් ගිවිසුම් සංවිධානයන් විසින් මේ මූළධර්මයන් නඩු තීන්දු නීතීන් සහ රාජ්‍ය වාර්තා විශ්ලේෂණය කිරීම් ඇතුලුව ඔවුන්ගේ අදාල විධි නියෝගයන් ක්‍රියාත්මක කිරීමේ දී ශක්තිමත්ව සමෝධානය කරගත යුතු අතර, විවිධ වූ ලිංගික නැඹුරුතාවය සහ ලිංගික අනන්‍යතාවයන් සහිත පුද්ගලයින්ගේ මානව අයිතීන් නීති භාවිතයන්ගේ යම් තැනකට සුදුසු නම් පොදු අදහස් දැක්වීම් හෝ අර්ථය පැහැදිලි කෙරෙන මූල ග්‍රන්ථ යොදා ගත යුතුය.

F. ලෝක සෞඛ්‍ය සංවිධානය සහ UNAIDS විසින් පුද්ගලයින්ට ඔවුන්ගේ ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාව සම්බන්ධිත සෞඛ්‍ය අවශ්‍යතාවන්ට අනුකූලව ඔවුනගේ මානව අයිතිවාසිකම්වලට හා අභිමානයන්ට උපරිම ගෞරවය ඇතිව සුදුසු සෞඛ්‍ය සේවා සහ සැළකිලි සැපයීමේ මාර්ග නිර්දේශයන් සංවර්ධනය කළ යුතුය.

G. සරණාගතයින් සඳහා වූ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් පුද්ගලයින් ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාව නිසා වද හිංසා ලැබීමේ අත්දැකීමෙන් සහ බියෙන් ආරක්ෂා කිරීමට මෙම මූළධර්මයන් සමෝධානය කරගත යුතුය, එමෙන්ම මානුෂික ආධාර හෝ අනෙක් සේවාවන් හෝ සරණාගත තත්වය නිර්ණය කිරීම ලැබීමේ දී කිසිම පුද්ගලයෙකු ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාව නිසා වෙනස්කම් කිරීමට ලක් නොවන බවට වගබලාගත යුතුය;

H. මානව අයිතීන් වෙනුවෙන් කැපවීමක් සහිත කලාපීය සහ උපකලාපීය අන්තර්-ආණ්ඩු සංවිධානයන් මෙන්ම කලාපීය මානව අයිතීන් ගිවිසුම් ආයතනද මෙම මූළධර්මයන් ඔවුන්ගේ විවිධ මානව අයිතීන්ගේ යාන්ත්‍රණයන්, ක්‍රියා පටිපාටීන් සහ අනෙකුත් සංස්ථාපනයන් සහ මුළපිරීම් සමෝධානික වන බවට වගබලාගත යුතුය;

I. කලාපීය මානව අයිතීන්ගේ උසාවි මානව අයිතිවාසිකම් ගිවිසුම් අර්ථ ගන්වන ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාව මත වන මේ මූලධර්ම ඔවුන්ගේ සංවර්ධනය වන අධිකරණ නීතිවලට සමෝධානික කරගත යුතුය;

J. ජාතික, කලාපීය සහ අන්තර්-ජාතික තලයන් හි දී මානව අයිතිවාසිකම් පිළිබඳව ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානයන් විසින් ඔවුන්ගේ සුවිශේෂ විධි නියෝග රාමුව තුළ මෙම මූලධර්මවලට සැළකිළි දැක්වීමට අනුබල දිය යුතුය;

K. මානුෂික සංවිධාන විසින් මෙම මූළධර්ම ඕනෑම මානුෂික හෝ සහන මෙහෙයුම්වල දී අන්තර්ගත කරගත යුතුය, එමෙන්ම ආධාර සහ අනෙකුත් සේවා ලබා දීමේ දී ලිංගික නැඹුරුතාවය හා සමාජ-ලිංගික අනන්‍යතාව නිසා වෙනස්කම් කිරීමට ලක් නොකළ යුතුය;

L. ජාතික මානව අයිතිවාසිකම් ආයතනයන් රාජ්‍ය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරකයින් විසින් මේ මූළධර්මයන්ට සැළකිලිමත් වීමට අනුබල දියයුතු අතර විවිධ ලිංගික නැඹුරුතාවය හෝ සමාජ-ලිංගික අනන්‍යතාව සහිත පුද්ගලයින්ගේ මානව අයිතීන් ආරක්ෂා කිරීම සහ ඒවාට අනුබල දීම ඔවුන්ගේ ක්‍රියාකාරිත්වයන්ට සමෝධානික කරගත යුතුය;

M. වෛද්‍ය, අපරාධ හෝ සිවිල් අධිකරණ සහ අධ්‍යාපන ක්ෂේත්‍රය ඇතුළුව වෘත්තීය සංවිධානයන් විසින් මේ මූලධර්මයන් ක්‍රියාත්මක කිරීමට ප්‍රබලව අනුබල දීම සහතික සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරීත්වයන්, සහ මාර්ග නිර්දේශයන් සමාලෝචනය කළ යුතුය;

N. වානිජ සංවිධානයන් විසින් මෙම මූලධර්මයන් ඒත්තුගෙන ඒ අනුව ඔවුනට හිමි වැදගත් භූමිකාව මත සිට ඔවුනගේම ශ්‍රම බලකායන්ට අදාලව සහ ජාතිකව හා අන්තර්ජාතිකව මෙම මූලධර්මයන්ට සැළකිල්ල දැක්වීම සහතික කරමින් අනුබල දිය යුතුය;

O. බහුජන මාධ්‍යයන් විසින් ලිංගික නැඹුරුතාවය සහ සමාජ-ලිංගික අනන්‍යතාව අදාලව ඒකාකෘතියන් භාවිතා කිරීමෙන් වැළකිය යුතුය, එමෙන්ම මිනිස් ලිංගික නැඹුරුතාවයේ සහ සමාජ-ලිංගික අනන්‍යතාවයේ විවිධත්වය පිළිගෙන ඉවසීමට අනුබල දිය යුතුය, එමෙන්ම මේ හා සම්බන්ධ කාරණා පිලිබඳව සාවධානී දැනුවත්භාවය නැංවිය යුතුය;

P. විවිධ ලිංගික නැඹුරුතාවයන් සහ සමාජ-ලිංගික අනන්‍යතාවයන්ට අයත් පුද්ගලයින්ගේ මානව අයිතිවාසිකම් වර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට රාජ්‍ය නොව සහ අනෙකුත් සංවිධානවලට ආණ්ඩුමය සහ පුද්ගලික අරමුදල් සපයන්නන් විසින් මූල්‍ය ආධාර ලබාදිය යුතුය;

ඇමුණුම

## යෝගියාකාර්ටා මූලධර්මයන් හි සාක්ෂිකරුවෝ

පිලිප් ඇල්ස්ටන් (ඕස්ට්‍රේලියාව) අධිකරන අත්තනෝමතික ක්‍රියාකාරකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත සහ ඇමරිකානු නිව්යෝක් යුනිවර්සිටි ස්කූල් ඔෆ් ලෝ හි නීතිය පිළිබඳ මහාචාර්ය

මැක්සිම් අත්මෙගිචන් (මෝල්දෝවා) ජාත්‍යන්තර කාන්තා සහ පිරිමි සමලිංගික යුරෝපීය සංවිධානය.

මවුරෝ කබ්රාල් (ආජන්ටිනාව) පර්යේෂණ නිලධාරී (යුනිවර්සිටි නැෂනල් ඩිකෝඩෝබා) ජාත්‍යන්තර කාන්තා සහ පිරිමි සමලිංගික මානව හිමිකම් කොමිසම.

එඩ්මන් කැමරන් (දකුනු අප්‍රිකාව) අභියාචනා ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර බ්ලොයෙම්පොන්ටින් දකුනු අප්‍රිකාව.

සෝනියා ඔනුෆ් කොරායා (බ්‍රසීලය) පර්යේෂන සහකාර බ්‍රසීලියානු අන්තර්ක්ෂේත්‍ර සංවිධානය (ඊෂ්) ලිංගිකත්ව ප්‍රතිපත්ති නිරීක්ෂකයේ සම සභාපති (විශේෂඥ කණ්ඩායම් හමුවේ සම-සභාපති).

යාකිත් එර්ටක් (තුර්කිය) කාන්තා හිංසනයට එරෙහි එක්සත් ජාතීන්ගේ විශේෂ නියොජිත මහාචාර්ය සමාජවිද්‍යා දෙපාර්තමේන්තුව මැදපෙරදිග කාර්මික විශ්වවිද්‍යාලය අන්කාරා තුර්කිය.

එලිසබැත් ඉවෑට් (ඕස්ට්‍රේලියාව) කාන්තාවන්ට එරෙහි වෙනස්කම් ඉවත් කිරීම පිළිඳ එක්සත් ජාතීන්ගේ හිටපු සාමාජික.

පෝල් හන්ට් (නවසීලන්තය) ලබාගතහැකි උසස්ම වෛද්‍ය පහසුකම් පිළිබඳ එකසත් ජාතීන්ගේ විශේෂ නියෝජිත සහ එක්සත් රාජධානියේ,සසෙක්ස් විශ්ව විද්‍යාලයේ, නීති අංශයේ මහාචාර්ය.

අස්මා ජහන්ගිර් (පාකිස්ථානය), සභාපති, පකිස්ථාන මානව හිමිකම් කොමිසම

මයිනා කායි (කෙන්යාව), සභාපති, කෙන්යා මානව හිමිකම් ජාතික කොමිසම

මිලූන් කොනාරි (ඉන්දියාව) නිවාස හිමිකම් ලබාගැනීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත.

ජුඩිත් මෙස්කුයිටා (එක්සත් රාජධානිය), ජේෂ්ඨ පර්යේෂණ නිලධාරී, මානව හිමිකම් මධ්‍යස්ථානය, එසෙක්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධනිය.

ඇලිස් එම් මිලර් (ඇමරිකා එක්සත් ජනපදය), සහකාර මහාචාර්ය, මහජන සෞඛ්‍ය විද්‍යාලය, අධ්‍යක්ෂක, මානව හිමිකම් වැඩසටහන, කොලොම්බියා විශ්වවිද්‍යාලය, ඇමරිකා එක්සත් ජනපදය.

සන්ජි බසිනෝනෝ මොනනේග් (බෙට්ස්වානා) විනිශ්චයකරු, උසස් අධිකරණය (ගැම්බියා සමූහාන්ඩුව) කොමසාරිස් මානව සහ කාන්තා අයිතීන් පිළිබඳ අප්‍රිකානු කොමිසම අමානුෂික සහ වධහිංසා කටයුතු පිටුදැකීම සහ නිවාරනය පිළිබඳ රොබින් අයිලන්ඩ් ප්‍රතිපත්තීන් පිළිබඳ සභාපති.

විටිට් මුන්ටාබෝන් (තායිලන්තය) ප්‍රජාතන්ත්‍රවාදී එක්සත් කොරියාවේ මානව හිමිකම් කටයුතු පිළිබඳ එක්සත් විශේෂ නියෝජිත නීතිය පිළිබඳ මහාචාර්ය චුලලොන්ග්කර්න් විශ්වවිද්‍යාලය තායිලන්තය (සම සභාපති විශේෂඥ කණ්ඩායම)

ලෝරන්ස් මූට් (කෙන්යා) කොමසාරිස්, මානව හිමිකම් පිළිබඳ කෙන්යා ජාතික කොමිසම



මැන්ෆ්‍රේඩ් නොවැක් (ඕස්ට්‍රේලියාව), අමානුශික ක්‍රියා, වධහිංසා සහ කෲර ලෙස සැලකීම් සහ ආත්ම ගෞරවය කෙලෙසීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත, ජ්‍යාත්තයන්තර විනිශ්චයකරුවන්ගේ කොමිසමේ සාමාජික, මානව හිමිකම් අයිතීන් පිළිබඳ මහාචාර්ය වියානා විශ්වවිද්‍යාලය ඕස්ට්‍රේලියාව අධ්‍යක්ෂක මානව හිමිකම් පිළිබඳ ලුඩ්විග් බොල්ට්ස්මන් ආයතනය.

ඇනා එලිනා ඔබැන්ඩෝ මෙන්ඩෝසා (කොස්ටාරිකා) ස්ත්‍රීවාදී නීතිපතිවරිය, කාන්තා මානව හිමිකම් ක්‍රියාකාරී ජාත්‍යන්තර උපදේශක.

මයිකල් ඔෆ්ලැනට් (අයර්ලන්තය), සාමාජික එක්සත්ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව මානව හිමිකම් මහාචාර්ය සම අධ්‍යක්ෂක මානව හිමිකම් නීති ආයතනය නොටින්ග්හැම් විශ්වවිද්‍යාලය එක්සත් රාජධානිය (යොගියාකාර්ටා මූලධර්මයන් සංවර්ධනය කිරීම පිළිබඳ විශේෂ නියෝජිත)

සුනිල් පැන්ට් (නේපාලය), සභාපති බ්ලූ ඩයමන්ඩ් සංගමය නේපාලය

දිමිත්‍රි පෙට්රොවා (බල්ගේරියාව), අධ්‍යක්ෂක සම අයිතිවාසිකම් භාරකාර මන්ඩලය.

රූඩි මොහොමඩ් රිස්කි (ඉන්දුනීසියාව), ජාත්‍යන්තර සමූහිකත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත ජේශඨ කතිකාචාර්ය වසිස්ඩීන් ඇකඩමික් අෆෙයාස් නීති පීඨය පඩ්ජාඩ්ජරාන් විශ්ව විද්‍යාලය ඉන්දුනීසියාව.

මේරි රොබින්සන් (අයර්ලන්තය) අයර්ලන්ත හිටපු ජනාධිපති, එක්සත් ජාතීන්ගේ හිටපු මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් නිර්මාපක, අවබෝධාත්මක අයිතීන් ලෝක ව්‍යාප්ත ආචාර විද්‍යා මුලපිරීම.

නෙවිනා මුකෝවි සා හොවික් (සර්බියාව) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත්ජාතීන්ගේ කොමිසමේ සාමාජික, සභාපති . ළමා අයිතිවාසිකම්, ආයතනය . බෙල්ග්‍රේඩ්, සර්බියාව.

මාටින් ෂීනින් (පින්ලන්තය) මානව හිමිකම් සහ ත්‍රස්තවාදයට එරෙහි එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත, මහාචාර්ය ආන්ඩුක්‍රම ව්‍යවස්ථා සහ ජාත්‍යන්තර නීතිය, අධ්‍යක්ෂක මානව හිමිකම් ආයතනය, අබෝ ඇකඩමි විශ්වවිද්‍යාලය පින්ලන්තය.

වෑන් යැන්හයි (චීනය) නිර්මාපක අයිස් (AIZHI) ක්‍රියාකාරී ව්‍යාප්තිය අධ්‍යක්ෂක බිජිං AIZHIXING සෞඛ්‍ය අධ්‍යාපන ආයතනය.

ස්ටෙෆන් විට්ල් (එක්සත් රාජධානිය), මහාචාර්ය සමානාත්මතා නීතිය මැන්චෙස්ටර් මෙට්‍රොපොල්ටන් විශ්වවිද්‍යාලය එක්සත් රාධානිය.

රෝමන් විස්ස්විස්කි (පෝලන්තය), එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමේ සාමාජික මානව හිමිකම් කොමිසමේ සාමාජික, මානව හිමිකම් පිළිබඳ පොසාන් සෙන්ටර් හි ප්‍රධානී.

රොබට් වින්ට්මුට් (කැනඩාව සහ එකස්ත් රාජධනිය), මහාචාර්ය මානව හිමිකම් නීතිය, නීතිවිශ්වවිද්‍යාලය, කින්ග්ස් විද්‍යාලය, ලන්ඩනය, එක්සත් රාජධානිය.